අනික් වචන එතැනට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

වගන්තිය, සංශෝධිතාකාරයෙන් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

விடப்பட்ட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

குறித்த சொற்கள் சேர்க்கப்படவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

9 ஆம் வாசகம், மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமென ஆணையிடப்பட்டது.

*Question, that the words proposed to be left out stand part of the Clause, put, and negatived.*

*Question, that those words be there inserted, put, and agreed to.*

*Question, that the Clause, as amended, stand part of the Bill, put, and agreed to.*

*Clause 9, as amended, ordered to stand part of the Bill.*

10 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause 10 ordered to stand part of the Bill.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රඥප්ති වගන්ති සහ නාමය කෙටුම්පතේ පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா திருத்தத்துடன் ஏற்றுக் கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන්, තුන්වනවර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப் பெற்று நிறைவேற்றப் பெற்றது.

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

අ. භා. 2.20

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order, please! The hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*



## ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත

*காணி அபிவிருத்தி (திருத்தம்) மசோதா*

## LAND DEVELOPMENT (AMENDMENT) BILL

පනත් කෙටුම්පත, ස්ථාවර කාරක සභාවෙහිදී සංශෝධනය කළ ආකාරයෙන්, සලකාබැලීමේ නියෝගය කියවන ලදී.

(நிலையற் குழுவில்) திருத்தப்பட்டவாறு பரிசீலிக்கப்படுவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for consideration, as amended (in the Standing Committee), read.*

CLAUSE 6.—(*Replacement of Section 13 of the principal enactment*)

සම්මත කරන ලද සංශෝධනය :

செய்யப்பட்ட திருத்தம் :

*Amendment made :*

In page 3, lint 21, at end add :

"(2) The Land Commissioner shall consider the scheme and diagram transmitted to him by the Government Agent under sub-section (1) and shall, within thirty days after the receipt of the scheme and diagram, decide whether a Land Kachcheri should be held or not.".

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I shall explain that first. At the Standing Committee none of the Members who moved amendments turned up. This amendment was introduced by the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera). He did not move it in Committee; I moved it on his behalf and it was passed.

වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause, as amended, ordered to stand part of the Bill.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**Clause 72.—(*Replacement of Section 143 of the principal enactment*)**

**සම්මත කරන ලද සංශෝධනය :**

செய்யப்பட்ட திருத்தம் :

*Amendment made :*

In page 29, line 4, leave out "may be effected by" and insert "may be given effect to upon".

වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පතේ පඬ්ඩිතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause, as amended, ordered to stand part of the Bill.*

**Clause 89.—(*Rights of persons who are in occupation of lands as permit-holders or owners on the date of commencement of this Act to elect whether they propose to hold such lands according to the provisions of the principal enactment as amended by this Act or not and consequences of such election*)**

**සම්මත කරන ලද සංශෝධනය :**

செய்யப்பட்ட திருத்தம் :

*Amendment made :*

In page 34, line 22, at end add :

"But where no permit has actually been issued to such person in respect of any land alienated to him on a permit, the Government Agent shall issue to such person a permit wherein the new terms and conditions applicable to such alienation shall be specified and if such person has already developed the land alienated to the satisfaction of the Government Agent, he shall be required to pay annually, in lieu of rent, a sum of such amount and for such period as the Government Agent may determine in accordance with regulations made under section 38 and the date on which such annual payments shall commence, the number of such payments and the amount of each such payment shall be specified in the permit."

වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පතේ පඬ්ඩිතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause, as amended, ordered to stand part of the Bill.*





**ගරු සී. පී. ද සිල්වා**

(கௌரவ சி. பி. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව සංශෝධිතාකාර යෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா திருத்தத்துடன் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## පළාත් පාලන සේවයේ සේවකයන්ට (විශේෂ විශ්‍රාම වැටුප් විධිවිධාන) පනත් කෙටුම්පත

உள்ளூராட்சிச் சேவை ஊழியர் (சிறப்போய் ஊதிய ஏற்பாடுகள்) மசோதா

## Local Government Service Employees (Special Pension Provisions) Bill

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது

*Order for Second Reading read.*

පූ. භා. 11.26

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන සේවයේ සේවකයන්ගේ (විශේෂ විශ්‍රාම වැටුප් විධිවිධාන) පනත් කෙටුම් පත දෙවන වර කියවීම මම යෝජනා කරමි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

රජයේ සේවයේ මෙන්ම පළාත් පාලන සේවයේ "ආදී ප්‍රවේශක" සේවකයන්ටද සිංහල භාෂාවෙන් වැඩ කිරීමට නොහැකිවීම හේතු කොට ගෙන 1964.6.30 වන දින හෝ එදිනට පෙර විශ්‍රාම ගැනීමේ මනාපය දෙන ලදී. විශ්‍රාම ගැනීමෙන් පසු අසනීපය නිසා විශ්‍රාම ගත් විට ලබෙන විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ඔවුනට ලැබිය යුතුව තිබුණි. විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රයෝජනයට ගෙන විශ්‍රාම ගත් එවැනි නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට පුළුවන්වීම පිණිස පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයේ රෙගුලාසි සුදුසු පරිදි සංශෝධනය කරන ලදී.

විශ්‍රාම ගැනීමේ මනාපයෙන් ප්‍රයෝජන ගත් සේවයේ "මාරු කළ" සාමාජිකයන් 23 දෙනාට එසේ විශ්‍රාම ගැනීමෙන් පසු ඔවුනට විශ්‍රාම වැටුප් ආදිය ගෙවීම සඳහා විධිවිධාන කිසිවක් නොතිබුණු බව සොයා ගන්නා ලදී. ඔවුන්ගේ විශ්‍රාම වැටුප් දීමනා ආදිය පාලනය වන්නේ විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවන් මගිනුයි. එසේ නැතහොත් පළාත් පාලන සේවයට මාරුවීමට පෙර ඒ අය සේවය කළ පළාත් පාලන ආයතනයේ රීතිවලිනුයි. සිංහල භාෂාවෙන් වැඩ කිරීමට නොහැකිවීම හේතු කොට ගෙන විශ්‍රාම ගත් අයට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එවැනි අතුරු ව්‍යවස්ථා සහ රීතිවලින් ඉඩ සැලසී නැත.

1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනත නිසා විශ්‍රාම වැටුප් රීති සම්පාදනය කිරීමට මහා නගර සභාවනට බලයක් නැත. එබැවින් මහා නගර සභා විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවන් හෝ රීති සංශෝධනය කිරීමටද නුපුළුවන. තවද, "සැනිටරි බෝඩ්" සහ මාර්ග කාරක සභා (රෝඩ් කොමිටීස්) වැනි ඇතැම් වෙනත් පළාත් පාලන ආයතන දැන් නැති නිසා ඒවායේ විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ රීති සංශෝධනය කිරීමට නුපුළුවන.

ඒ නිසා සිංහල භාෂාවෙන් වැඩ කිරීමට නොහැකිවීම හේතු කොට ගෙන 1964.6.30 වන දින හෝ එදිනට පෙර විශ්‍රාම ගත්, විශ්‍රාම වැටුප් ආදිය නොගෙවන ලද "මාරු කළ" සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් ආදිය ගෙවිය හැකිවීම පිණිස මෙම විශේෂ ව්‍යවස්ථා ඉදිරිපත් කරනු ලැබේ.

As in the Public Service, "old entrant" employees of the Local Government Service were given the option of retiring on or before 30.6.64, on grounds of inability to work in the Sinhala language. On retirement they were to receive the pension or gratuity they would have received as if they had retired on grounds of ill-health. The Local Government Service Pension Scheme regulations were suitably amended to enable the payment of pensions, etc., to such officers as exercised the option to retire.

It had since been found that there was no provision for the 23 "transferred" members of the service, who had opted to retire, to be paid pensions, etc., on such retirement. The grant of pensions, etc., to them are governed by the pension by-laws or rules of the local authorities in whose employ they were immediately prior to their transfer to the Local Government Service. Such by-laws and rules did not provide for the award of pensions, etc., to those who had retired on grounds of inability to work in the Sinhala language.

The pension by-laws or rules of municipalities cannot be amended now, as, with the enactment of the Municipal Councils Ordinance, No. 29 of 1947, they have no power to make pension rules. Also, some of the other local authorities such as sanitary boards and road committees are defunct and their pension by-laws or rules too cannot now be amended.

Hence, this special legislation is being brought in to enable the payment of pensions, etc., to the "transferred" members concerned who had retired on or before 30.6.64 on grounds of inability to work in the Sinhala language, and have not been paid their pensions, etc.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.30

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The Hon. Minister's Bill which he has presented before us is one that had been promised some years ago.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

Not by me.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

It has long been delayed, but we are glad that this concession is now being given, even though so belated, to those persons who retired.

The Hon. Minister told us once before that he is bringing a comprehensive Pensions Act and that he does not wish to do these things piecemeal. Having made that announcement, the Hon. Minister has already brought two Pensions Bills before this House.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I mentioned this one on that occasion, and I said I would bring this.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The Hon. Minister has already brought two Bills, and, as far as the general pensions position is concerned, I cannot discuss a Bill which has not been brought. But the general position contained in the Minister's substitute for the Local Government Commission Ordinance is not an entirely satisfactory one.

The Hon. Minister will forgive me if I refer to a matter on which he wrote to me after the last discussion we had, namely, this question of the commutation of pension. Even this right that is being given to these people does not necessarily carry the right of commutation.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

Under the L.G.S.C. Bill I have the power.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

You " may ". That is what the Bill says.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I will.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

As I said, I cannot discuss a Bill which is not yet a subject of discussion before this House. The Hon. Minister's reply is a little surprising. I raised the case of an officer of the Kandy Municipal Council who had retired and had obtained the commuted pension on the basis of a reading of the Kandy Municipal Council's Pension Minute together with the Government Pension Minute. Now that the rstoration of full pension after 12½ years has been decided for the Public Service, this officer applied for the restoration of his full pension. I asked that question on the Floor of the House, and the Hon. Minister gave a reply. The reply was that he was entitled to it, but no order could be made to pay because the local authorities would not generally be able to pay this. As against that, the Kandy Municipal Council resolved to pay, and they had the money. But still, it could not be adjusted and the matter could not be settled. Then came the Minister's last Bill, and on that occasion I mentioned it. The Hon. Minister has written to me since then. I have not brought the letter here, but I remember very well its contents. The first portion of the


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

letter was a misdirection of the Minister by himself. He says this officer has asked for commuted pension rights on the basis of a reading of the Kandy Municipal Council Pension Minute with the Government Pension Minute, because the Kandy Municipal Council Pension Minute said that where a matter is not provided for in that minute recourse shall be had to the Government Pension Minute for the resolution of any doubts. Now, that is incorrect. The K. M. C. Pension Minute provided for commutation, and commutation was not granted in that instance on the basis of an interpretation given under the Government Pension Minute. So the first portion of the Hon. Minister's letter is incorrect.

The second portion of the letter says that now he is asking for the restoration of the full pension after 12½ years. This was not in the Government Pension Minute when the K. M. C. Pension Minute was drafted. So, where the K. M. C. Pension Minute said that any matters not provided for there shall be referred to the Government Pension Minute, that was not for something as important as the restoration of full pension but for minor matters. That was not fair. If the Hon. Minister consults legal opinion he will find that anybody would uphold the position that, if the interpretation is given as if the statute is being interpreted, that where the K. M. C. Pension Minute said that any matters not provided for in that minute shall be interpreted in accordance with the Government Pension Minute and the Government Pension Minute, and the Government Pension shall be restored, that man is entitled to his full pension. To state that this was not what was contemplated is both unfair and improper.

I agree with what the Hon. Minister says in the last part of his letter, namely, that it is not possible now to amend the K.M.C. Pension Minute. It is totally unnecessary. The K. M. C. Pension Minute says he is entitled to commute his pension. It also says that where any matter is not provided for in it recourse shall be had to the Government Pension Minute. The Government Pension Minute now provides for the restoration of the full pension after 12½ years. Therefore, this officer is entitled to it. As to whether the council can pay or not, the Kandy Municipal Council has resolved that he should be paid. All I am asking is this. Will the Hon. Minister even now make an order that he be paid ? He will be prepared to get that matter adjusted.

That is the particular matter which I wanted to raise because the Hon. Minister discussed this question on the last Pension Bill that was brought by him and he was gracious enough to write to me on the question thereafter giving me further information. On the particular question of the rights of persons who have retired, as I said, we have nothing in this Bill to oppose. The Hon. Minister has brought this Bill and as he says he never promised it earlier ; it had been promised earlier but it did not come before the House. We are glad that this facility is being offered to a number of officers who have been languishing for want of their pension rights for several years.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I assure the hon. Member that I shall go into that matter again. I am as keen as he is to grant relief to this particular person. I had my own particular difficulties. In fact, I shall be submitting some proposals to the Cabinet on this subject matter. Anyway, I shall look into the matter further.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පනත, ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப் பெற்று நிறைவேற்றப் பெற்றது.

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළාත් පාලන සේවයේ සේවකයන්ට (විශෙෂ විශ්‍රාම වැටුප් විධිවිධාන) පනත් කෙටුම්පත —කාරක සභාව

මතු පළ වන යෝජනාව සභාසම්මත විය.

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු ප්‍රේමදාස]

பின்வரும் பிரேரணை ஏற்றுக் கொள்ளப்பட்டது :

"மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக" [கௌரவ பிரேமதாச.]

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. Premadasa.*]

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**

**[කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.]**

*முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது [குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் தலைமை தாங்கினார்கள்]*

. *Cons:dered in Committee.*

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*]

**1 වන වගන්තියේ සිට 4 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

*வாசகம், மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.*

*மசோதா திருத்தமின்றி ஏற்றுக் கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.*

*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

I move,

"That the Bill be now read the Third time".

සමුපකාර සමිති ණය (විශෙෂ විධිවිධාන) පනත් කෙටුම්පත—දෙවන වර කියවීම

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වනවර කියවා සම්මත කරන ලදී.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப் பெற்று நிறைவேற்றப் பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## සමුපකාර සමිති ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

### கூட்டுறவுச் சங்கக் கடன்கள் சிறப்பேற்பாடுகள்) மசோதா

## CO-OPERATIVE SOCIETIES LOANS (SPECIAL PROVISIONS) BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

පූ. භා. 11.38

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I move,

"That the Bill be now read a Second time."

The availability of credit, particularly to the rural sector, is a very important factor to assist agricultural production, especially the production of food. From as far back as 1947 rural credit has been made available to cultivators. From time to time, as a result of experienced gained in the implementation of credit schemes, various changes in those schemes have taken place both in relation to the administration of the schemes as well as towards the liberalization of credit.

During the very early stages the institutions that were handling the scheme were the C.A.P. and S. societies. Later, multi-purpose co-operative societies dealt with agricultural credit in the rural areas. So, the institutions that were made use of for the purpose of dealing with agricultural credit were always the co-operative societies.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

From time to time credit schemes have been modified and liberalized, and after the last liberalization credit was granted up to Rs. 34 million. The year after that scheme was implemented it was found that recoveries began to fall due to one reason or another.

This aspect of the problem was studied by a committee, and because of the need to supply credit to as large a number of peasant farmers and cultivators as possible and, being credit, because of the need to have a high percentage of recoveries in the interest of the credit schemes, certain changes were made in the scheme that existed at that time.

Prior to the changes, agricultural credit was given by the Commissioner of Agrarian Services through the co-operative societies. Applications were channelled through the co-operative societies and were recommended or not depending upon the financial standing of the particular societies, and the Commissioner of Agrarian Services supplied the credit.

This was found to be somewhat of a bottle-neck because applications from all over the country had to converge on one point for acceptance, and when there were discrepancies between the societies' accounts and what were filed with the Commissioner of Agrarian Services in respect of the loans taken, repaid, and so on, there was a tendency for credit to be delayed and the cultivation season to be well on its way before the credit reached the cultivators. In fact, in a fair number of cases the cultivation season was over by the time cultivators got the credit approved.

With a view to removing these impediments and on the recommendation of the committee that went into the functions of the agricultural credit scheme, certain changes were effected. One such change was the utilization of the People's Bank and its branches throughout the Island for the purpose of granting agricultural credit. Therefore, the function performed by the Agrarian Commissioner devolved on the People's Bank. The Central Bank, I think, had to be the guarantor or something like that for any defaults up to a certain percentage, and on that basis the People's Bank was drawn into this credit scheme. It was also possible to utilize the Bank of Ceylon, if it had the institutions and the societies were willing, with the approval of the Commissioner for Co-operative Development. Nevertheless, it was the People's Bank that came to be utilized in the dispersal of agricultural credit.

Now, the existing structure of a co-operative society, as an institution at village level, was used for granting this credit to the applicants. We found from the performance over the past so many years—quite apart from the fact of these institutions being utilized for granting credit—that there were impediments and bottle-necks in the granting of loans, and they were removed in the way we sought to remove them in order to make credit available to the cultivators by the time the season started or well ahead of the commencement of the cultivation season.

In the case of recoveries, they were not satisfactorily coming in. There were cases where people had not been able to pay back the loans in time due to certain reasons, valid reasons, like crop failures. But, by and large, a large number of people who were able to repay the loans were not paying them back and as a result the activities of the co-operative societies as lending institutions had to be restricted. As a consequence of defaulters not paying the loans back, the amount of money that the societies could get from the Agrarian Commissioner or from the bank dwindled because the whole credit scheme rested not only on the granting of loans but also on the recovery of a high percentage of the loans.

When loans are given, generally there is some sort of security for the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

recovery of the money. What happened in the case of loans that were given in the past was that societies could not recover the loans, and as a result they automatically dropped out of the loan scheme and therefore the number of cultivators who were able to get loans began to be less and less. That is the experience we have had over the years.

Now, as a form of security and also as a means of inducing recovery, the Government thought—the Government considered the recommendations of this committee—that it must be made a condition that when a loan is given the person who applies for the loan should tender as security his ration book and those of his family. Now, it works out like this.

The co-operative society enters into a bond with a particular borrower covering his ration book and those of his family, with the result that if the loan is not repaid within the stipulated period the rice coupon books are withheld. This is reported to the Food Commissioner, and the Food Commissioner assesses the value of the rice coupons at the time of the recovery, and such value is credited to the defaulter.

Every person who is a borrower for agricultural credit purposes enters into a bond with his respective co-operative society, and thereafter, through the machinery of the People's Bank and co-operative societies, the loans are given. In the case of those persons whose cultivation has failed and who are not in a position to repay the loan, extension is given administratively over a period of three seasons to repay the loan. Such a person is regarded as a non-defaulter for the next cultivation season. In the case of those who are in a position to pay but do not do so, their rice coupons are recovered and in respect of these coupons a certain money value is credited to their account in liquidating the loan. Over the last year the value given by the Food Commissioner for a coupon has been Re. 1.

This scheme was introduced by regulation under the Food Control Act, No. 21 of 1950. Section 6 (2) (*g*) of this Act says that the Minister may make regulations in respect of "the surrender of any books, coupons or other documents issued for the purposes of this Act." Regulations were framed under this section on 2nd September 1967. These regulations were again promulgated with certain additions on 26th November 1967 and appear in Gazette No. 14,776/7.

In terms of the regulations under the Food Control Act this scheme was implemented. Then, when certain problems arose I discussed this matter with the Legal Draftsman as well as the law officers, and there appeared to be a doubt. Some were of the view that the regulations were perfectly in order, which others had a lurking doubt about them. We thought it best to introduce legislation for the purpose. This Bill has been brought as a result of the advice we got.

I would ask all hon. Members to read the statement of legal effect given in the Bill. Hon. Members will see that this is meant to cover all those points I just mentioned and to remove any doubts that exist. The statement of legal effect clearly explains this matter.

I would like to refer hon. Members to page 149 of the Annual Report of the Central Bank of Ceylon for the year 1968 where this new agricultural credit scheme is fairly well explained. Here and there there may be a few interferences that may not be quite accurate. Nevertheless, this new agricultural credit scheme is fairly well explained there.

At page 150 of this same report you find Table II (D) 15. According to this table, the amount released to co-operative societies under this scheme for Maha 1967-68 was Rs. 61.4 million; the amount voluntarily repaid by members was Rs. 42.6 million; the amount recovered through rice ration coupons was Rs. 4.6 million. Total recoveries amounted to Rs. 47.2 million. The amount of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

loans extended due to crop failure was Rs. 3 million ; the amount of loans in default was Rs. 11.2 million. According to this very same table, the percentage of total recoveries was 76.9.

I have got with me a further statement which gives the latest figures not covered by the Central Bank Report. In any case the figures given in the Central Bank Report by and large provide useful material for hon. Members to find out how the new agricultural credit scheme has been functioning. I want to impress this on all hon. Members of this House. Whatever the scheme, it is very necessary—I think this is a position that will not be contested by anybody—that agricultural credit should be made available easily if production is to increase in this country. By means of this new extended credit scheme not only has it been possible to almost double the extent of loans given in the past to cultivators but also it has greatly assisted them in their production. They have been able to do a great deal of their ploughing, to purchase good seed paddy and good seed varieties, and to purchase manure and all the inputs that are necessary in time, increasing production particularly in paddy.

The number of persons who have been drawing loans is much bigger and the amounts have been higher. In the changes that were brought about we did not create any institutional change by way of bringing the People's Bank into this. There was a change in the quantum of the loan that was granted to cultivators. Earlier, for a number of operations the amount given per acre was Rs. 175 and a person could, if he had two shares in the co-operative society, have drawn loans up to a maximum credit covering five and two-third acres.

In order to assist in a very liberal way the food production programme, particularly paddy production, and also taking into consideration the cost factors that were involved, this scheme was further extended or liberalized by raising the limit from five and two-third acres to ten acres.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Before the luncheon adjournment I dealt with the new scheme of agricultural credit, and I dealt with the increase in the amount of the loan per acre depending upon various factors. I commend the Bill to the House.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 2.2

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මෙම පනත ඉදිරිපත් කරමින් ගරු කෘෂි කර්ම ඇමතිතුමා කළ කථාවෙන් විශේෂ යෙන් ඔප්පු වන එක් කරුණක් තිබේ නවා. එනම්, ආහාර පාලන පනතේ විධි විධාන යටතේ මෙතෙක් කල් ආණ්ඩුව අනුගමනය කර ඇති ප්‍රතිපත්ති සම්පූර්ණ වශයෙන්ම නීත්‍යනුකූල නොවේය යන සැකයක් මතු වී තිබෙන නිසා මෙම පණත ඉදිරිපත් කර තිබෙන බවයි. පසුගිය අවු රුද්දේ ප්‍රථම වරට, මහජන බැංකුවෙන් දෙන ලද ණය මුදල් සඳහා ඇපයක් වශයෙන් හාල් සලාක පොත් ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරම්භ කරන්නට යෙදුණා. ඒ අවස්ථාවේදී මෙම ගරු සභාවේ මන්ත්‍රීවරුන් කිපදෙනකුම—අප සියලුදෙනාම—රජය ගත් ඒ පියවර තදින්ම හෙළා දකිමින් ඊට අපගේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ හැර, ණය මුදල් වෙනුවෙන් හාල් සලාක පොත් ගැනීමත් සලාක කැපීමත් නීති විරෝධි ක්‍රියාවක් වන බව පෙන්වා දුන් මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) එම පියවරට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පවා යම් යම් පියවරවල් ගන්නට සිදු වන බවත් කියා සිටියා. රජය එදා ගත් පියවර යුක්ති සහගතයයි පෙන්වන්නට කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත්, විශේෂයෙන්ම ගරු ඇමතිතුමාත් කියා සිටියේ, නීතිය අතින් කිසිම පරහක් ඒ සම්බන්ධයෙන් නොපෙනෙන නිසා ඒ පියවර ගත් බවයි.

මේ ප්‍රශ්නයේ මුහුණුවර දෙකක් තිබෙනවා. ඉන් එකක් නම්, ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද තර්කයට අදාළ වූ මුහුණුවරයි. මහජන බැංකුවෙන් හෝ ඊට කලින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ ගැමි ජනතාව ණය මුදල් ලබා ගත්තායින් පසු එම ණය බේරීමට නිසි පියවර නොගත් නිසා, ඒ සම්බන්ධව තරමක් තදින් ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගේ කමිටුවෙන් නිර්දේශ කෙරුණු බවයි එතුමා කියා සිටියේ. මේ අදහස දෙවිධියකට මතින්නට පුළුවනි. ආණ්ඩුව ණය මුදල් පමණක් ආරක්ෂා කරන්නට බලතොත්, ඒ අතින් මුල පුරා මේ ප්‍රශ්නය ගැන කල්පනා කර බලතොත්, ඕනෑම දෙයක් යුක්තිසහගතයයි කියන්නට ආණ්ඩුවට පුළුවනි. එහෙත් අපේ ගැමි ජනතාවගේ ණය තත්ත්වයත් ඔවුන්ගේ දරිද්‍ර භාවයත් හරියාකාර සලකා බලතොත්, දැනට ඇති වී තිබෙනවායයි කියන සංවර්ධනය ගැන ගරු අගමැතිතුමාත් කෘෂිකර්ම ඇමතිතුමාත් කොපමණ දුරට කථා කළත්, ගැමියාගේ පරිහරණයට අවශ්‍ය මුදල් ඔහු අතේ ඇතැයි කොපමණ කීවත්, ගැමි ජනතාව සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ වලින් ඔප්පු වන්නේ ඔහුගේ ණයගැති භාවය පිළිබඳ නියම විධියේ විසඳීමක් මේ කාල පරිච්ඡේදය තුළ සිදු වී නැති බවයි; ඔහුගේ ණයගැති භාවයේ අඩුවක් වී නැති බවයි. පවුලේ අයගේ අසනීප, දරුවන්ගේ කටයුතු, දරුවකු පාඨශාලාවට යැවීම, විශ්වවිද්‍යාලයට යැවීම, ගෙදර මරණයක් සිදු වීම, පවුලේ කෙනකුගේ සරණ බන්ධනයක් සිදු වීම, වන්දනා ගමන්, පින්කම් යනාදී වූ නොයෙක් දේ නිසා ගැමියා ණය වෙනවා. මහජන බැංකුවෙන් ණය මුදල් දීමේ පිළිවෙළත් දැන් වෙනස් වී තිබෙනවා. ඉස්සර අය කෙරුණු පොලියට වඩා අධික පොලියක් දැන් මහජන බැංකුව අය කරනවා. මේ අන්දමට මුදල් ගැනීමෙන් වුවත් ඇත්තටම තමන්ට අයිති වූ කෘෂිකාර්මික කටයුතු සඳහා මහජන බැංකුවෙන් ගත් ණයට අමතරව වෙනත් අයටත් ණය වන්නට සිදු වෙනවා.

අද ගොවියා සාමාන්‍යයෙන් ඉඩම් හිමියාට ණයවීම අපේ රටේ චිරාගතවම සිදුවන එකක්. සෑම කරුණක් පිළිබඳවම ණය වෙනවා. කුඹුරු පනත මාර්ගයෙන් සහනයන් සලසා දී මේ ණයගැති භාවයෙන් ගොවියා මුදාගන්නටයි වර්තමාන කර්මාන්ත හා ධීවර ඇමතිතුමා එදා කෘෂිකර්මය භාරව සිටියදී කුඹුරු පනත ගෙනාවේ. එහෙත් ග්‍රාමීය ප්‍රදේශවල වත්කම් අනුව ජනතාවගේ වෙනස්වීම් පනතකින් සම්පූර්ණයෙන්ම මකන්නට බැහැ. යම් වත්කමක් ඇති අය දුප්පත් අය සූරා කෑමට මාර්ගයන් කොයිතරම් නීතිරීති තිබුණත් සොයා ගන්නා බව කවුරුත් දන්නා කරුණක්. ඒ අනුව කුඹුරු පනත අද මුළු රටටම ගැලපෙනවාය කියා අපේ ඉඩම් ඇමතිතුමා කියන නමුත් ඇත්තෙන්ම එය නිසි පිළිවෙළට ක්‍රියාත්මක වන බවක් අපට නම් පෙනෙන්නට නැහැ. සමහර තැන්වල අතරින්පතර කුඹුරු පනත යටතේ සහනයන් ගන්නට ගැමි ජනතාව ඉදිරිපත් වන බව නම් පෙනෙනවා. එහෙත් පුළුල් වශයෙන් එය වෙනවාය කියා කියන්නට බැහැ. ඒ පනත යටතේ ඔවුන්ට ලැබෙන්නට තිබෙන වාසි පවා ලැබෙන්නේ නැහැ. කරුණු මෙසේ තිබෙන නිසා විශේෂඥයින් සොයාගෙන තිබෙන කරුණු අනුව ගොවිතැන පිළිබඳව කොතරම් සරු සාර බවක් ඇතිවුණාය කියතත් ඇත්තෙන්ම ගොවිජනතාවගේ ණයගැතිවීම සැහෙන පිළිවෙළකට අඩුවුණාය කියන එකට නම් සාක්ෂි ඇත්තේ නැහැ. මේ පදනම පිළිගන්නවා නම් ආණ්ඩුව විසින් දෙනු ලබන ණය මුදල් කෙසේ හෝ අය කර ගන්නට ගැමියන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගේ සලාකය කපා ගැනීම යුක්තිසහගත යයි කියා කාටවත් කියන්නට බැහැ. එය අයුක්තිසහගතයි. එය දරුණු ක්‍රියාවක්.

මහ බැංකුවේ වාර්තාව අනුව ණය මුදල් ආපසු ගෙවීම සියයට 69.6 ක්ය කියා තිබෙන එක ඇත්ත තමයි. සලාකය කපා ගෙන ඒ මගින් පොළිත් සමග අයකර ගන්නට සිදු වූ ණයමුදල් ප්‍රමාණය සියයට 7.6 ක් පමණක්ය කියාත් ඒ මහබැංකු වාර්තාවෙන් ප්‍රකාශ කර තිබෙනවා. ඒ දෙකෙහි එකතුව වශයෙන් සියයට හැත්තෑ ගණනක් ආපසු ලබා ගන්නට පුළුවන් වුණාය, මීට පෙර මේ විධියට ණය මුදල් ආපසු ලබා ගන්නට පුළුවන් තත්ත්වයක් තිබුණේ නැත කියාත් ඒ වාර්තාවේ සඳහන් වෙනවා. මේවායින් ඔප්පු කරන්නට හදන්නේ සලාකය කපා ගැනීම යුක්ති සහගතය කියන එකයි. මේ කරුණු මේ විධියට යොමු කර තිබෙන්නේ මහ බැංකුවේ පාලකයින්ගේ ස්ථාවරය අනුවයි. මනුෂ්‍යයන් වශයෙන් ගැමි ජනතාව ගැන අනුකම්පාවක් ඇති පිරිසක් වශයෙන් හෝ රටේ දිළිඳුකම ගැන කල්පනා කරන පිරිසක් වශයෙන් හෝ ඒ අය මේ ප්‍රශ්නය කෙරෙහි හිත් යොමු කර නැහැ. බැංකුවක් ණයක් දෙන විට එය ආපසු ලබාගන්නා ක්‍රමය ගැනයි පළමුවෙන්ම බලන්නේ. මුදලක් පොළියට දෙන තැනැත්තා පොළියත් සමග ඒ මුදල ආපසු ලබාගන්නේ කොහොමද කියන කරුණ ගැනයි ප්‍රධාන වශයෙන් බලන්නේ. මේ පදනම උඩ අපේ කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රශංසනීය වචනවලින් අපට පිළිගැන්වූ මේ මහබැංකු වාර්තාවේ ඇති මේ කරුණ ගැන නම් අපට සෑහීමකට පත් වන්නට බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඡන්දය බලාපොරොත්තු වන සෑම කෙනෙක්ම ගැමි ජනතාවගේ තත්ත්වය නගා සිටුවීමට විශේෂයෙන් උත්සාහයක් දරනවා. අපේ රටේ වැඩි ඡන්දදායකයින් ගැමි ජනතාවයි. එම නිසා මොන ප්‍රතිපත්ති අනුගමනය කරන ආණ්ඩුවක් වුණත්, ගැමි ජනතාවට සහනයන් ලබා දෙන්නට බැරි නම් යටත් පිරිසෙයින් ඔවුන් රවටන්නටවත් උත්සාහ කරනවා. එහෙත් ඒ ප්‍රතිපත්තිය එක තැනකදී සම්පූර්ණයෙන් බිඳ වැටෙනවා. මේ රටේ වත්කම් ඇති අයට පහරක් වදින බව දැන ගන්නට ලැබුණු හැටියේම තමුන්නාන්සේලා ඔවුන් රැවටීම සම්පූර්ණයෙන්ම නවත්වා, ඔවුන්ට එළිමහනේම ගසා කන්නට අවස්ථාව සලසා දෙනවා. මේ තත්ත්වය යටතේ තමයි, වගා ව්‍යාපාරයෙන් විශාල වශයෙන් මුදල් ලැබී තිබෙනවා යයි තමුන්නාන්සේලා පුරසාරම් කියන්නේ.

අර්තාපල්, ඇනු හා සමහරක් කුළු බඩු වගා කරන්නට ඉදිරිපත් වූ අයට නම් කලින් තිබුණාට වඩා කෙටිකාලීන වාසියක් තිබෙන බව ඇත්තයි. එහෙත් ඒ වගාවනට අදාළ වූ යම් යම් ප්‍රශ්න විසඳා ගන්නට බැරි වීම නිසා, රජයෙන් ඊට ආධාරයක් නැති නිසා, වෛරස් බීජ මාර්ගයෙන් බෝ වන රෝග මැඩලීමට නිසි ව්‍යාපාර මේ රටේ නැති නිසා, ඒ වාසියත් දැන් බොහෝ දුරට අඩු වී තිබෙනවා.

ඊළඟට වී වගාව ගෙන බලමු. මෑත ඉතිහාසය දෙස බලන විට මේ රටේ වී වගාව දෙවරක් තුන් වරක්ම ඉතා පහළ මට්ටමකින් පටන් ගෙන ඉහළ පියවරකට නැග්ග බව ඉලක්කම්වලින් පෙනෙනවා. 1956 අවුරුද්දේත්, ඉන් පසු සුළි සුළං හා නියගය නිසා 1964-65 අවුරුද්දේත් ලංකාවේ වී නිෂ්පාදනය ඉතාමත් පහත් මට්ටමකට බැස්සා. මුලින්ම ජපන් ක්‍රමය අනුව තවාන් කිරීමේ පිළිවෙළ මේ රටේ පැතිරෙන්නට පටන් ගත් නිසාත්, ප්‍රථම වරට රසායනික පොහොර පාවිච්චිය පටන් ගත් නිසාත් වී නිෂ්පාදනයේ දියුණුවක් පෙනෙන්නට තිබුණා. 1964-65 අවුරුද්දේ පහත බැස්ස ප්‍රමාණයේ සිට දැන් නැවත වරක් වී නිෂ්පාදනය දියුණු වී තිබෙන බව නම් පිළිගන්නට පුළුවනි. එසේම නවීන පොහොර වර්ගත්, නවීන බිත්තර වී වර්ගත්, ට්‍රැක්ටර් සහ වෙනත් යන්ත්‍රෝපකරණත් වැඩිපුර පාවිච්චි කිරීම නිසා වී නිෂ්පාදනයේ දියුණුවක් ඇති වී තිබෙන බවත් පිළිගන්නවා. මේ ප්‍රශ්නයට යම් ප්‍රමාණයකට මුහුණ දෙන්නට කුඹුරු පනතින් උත්සාහ කළා. එය සම්පූර්ණයෙන් සාර්ථක නොවූවා පමණක් නොව, එයත් දැන් කඩාකප්පල් වී තිබෙනවා. තම අස්වැන්න අලෙවි කර ගැනීමට තිබෙන අපහසුකම මේ ප්‍රශ්නය තුළ තිබෙනවා. බිම් කැබැලිවල කුඩාකම නිසා ඒවායින් නියම ඵල ලබා ගැනීමට තිබෙන අපහසුව තවත් එකක්. එසේම අඳයට හා තට්ටු මාරු ක්‍රමයට ගොවිතැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීම යනාදී කරුණු රාශියක් තිබුණත්, ඒවා ඉවත් කිරීමට හැම ආණ්ඩුවක්ම අපොහොසත් වුණා. මේ කරුණු හේතු කොටගෙන, රසායනික පොහොරවලින් හා නවීන බිත්තර වී සහ නවීන යන්ත්‍රෝපකරණ භාවිතයෙන් ඇති වන දියුණුවේ සීමාවක් ඇති වීම නියතයි.

දැන් ගැමියන් අතරේ වැඩිපුර මුදල් තිබෙන බව, මුදල් හුවමාරු වන බව ඇත්ත. කලින් තිබුණු ප්‍රමාණයට වඩා, වටිනාකම සියයට 20 කින් අඩු කළ රුපියලේ කාසි වැඩිපුර දැන් ඔවුන් ළඟ තිබෙන බව ඇත්ත. එසේ නියම අන්දමින් රුපියලේ අගය සියයට 20 කින් අඩු කළා හැරෙන්නට, විවිධ ක්‍රමය මාර්ගයෙන් රුපියලේ අගය අනියම් අන්දමිනුත් අඩු කළා. මෙසේ දෙවරක්ම රුපියල බාල්දු කිරීම—අගය අඩු කිරීම—නිසා, දේශීය ආදායම අතින් වැඩිපුර රුපියලේ කාසි ප්‍රමාණයක් දැන් අප සමාජයේ හුවමාරු වෙනවා. ඒකේ ලකුණු දෙකක් තිබෙනවා. එකක් බඩු මිල ඉහළ නැගීමයි. නොසෑහෙන ප්‍රමාණයට යම් කිසි කෙනෙකුගේ ආදායම දෙගුණයක් වැඩි වී තිබෙනවාය කියා කෙටි කාලීනව මැන බලනවා නම් වියදමත් දෙගුණයකට වඩා වැඩි වී තිබෙනවා. මේකයි ඇත්ත. මේ කරුණු සඟවා මේවා සිත් ඈත්ව යම් ප්‍රශ්නයක් විසඳන්නට යම් කෙනෙක් උත්සාහ කරනවා නම් එය තමන්ගේම හිත හදාගන්නට කරන වැඩක්. බලාපොරොත්තු සුන් වූ තත්ත්වයෙන් බලා සිටින්නට උත්සාහ කරන දේශපාලනඥයන්ට නම් පුළුවන් මේවා සිත් හිත සනසා ගන්න. එහෙත් යම් කිසි ප්‍රශ්නයක ඇති තතු සලකා විසඳන්නට වුවමනාවක් තිබෙනවා නම් ඉච්ඡා බසින් රැවටිල්ලට පෙළෙඹෙන්නේ නැතිව සමාජයේ තිබෙන මේ කරුණු ගැන විග්‍රහයක් කර ගැමියාගේ තත්ත්වය ගැන නිසි විධියට සලකා යම් පිළියමක් යොදන්නයි සිදු වන්නෙ.

ඔව්, බඩගින්නේ සිටින්නට සිදු වනවාය කියන තර්ජනය කර ගැමියාගෙන් ඒ මුදල ආපසු උදුරා ගන්නට පුළුවන්. එපමණයි සිදු වන්නෙ. මහා බැංකුවෙන් කරන්නෙ මොකක්ද ? බැංකුවකට හිතක් නැහැ. බැංකුවකට පපුවක් නැහැ. බැංකුවක් කියන ආයතනය කිසිම විධියක අනුකම්පාවක් ඇති ආයතනයක් නොවෙයි. විශේෂයෙන්ම මහා බැංකුවේ ස්වභාවය ඒකයි. ඒවායේ පාලනය ගෙන යන පුද්ගලයන් තමන්ගේ පෞද්ගලිකත්වයෙන් මනිනවා නම් බොහෝම හොඳ ගුණධර්ම පිළිපදින අනුකම්පාවක් ඇති උදවිය වෙන්න පුළුවන්. ඒ ගතිගුණ නැතැයි මා කියන්නෙ නැහැ. එහෙත් ඒ බැංකු පාලකයන් වාර්තා ලියන්නට පටන්ගත් විට ඒ ගතිගුණ වලින් තොරවයි ලියන්නෙ. ඒ නිසයි බඩගින්නේ තැබීමේ තර්ජනයක් එල්ල කර ඒ මුදල් ආපසු උදුරා ගැනීමේ අදහස පෙරදැරි කරගෙන මහා බැංකු වාර්තාව ලියා තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පනත්වලින් කෙරෙන අසහනය පිළිබඳ නිසි මැනීමක් නියම විධියට කළොත් කාරණා බොහෝ දුරට පැහැදිලි වෙනවා. මෙම පනතින් අඩු වයසේ සිටිය අයගේ සලාක පොත් උගස් තබා මුදල් ගැනීමට බලයක් දෙනවා. තමන්ගේ නිවාසයේ සිටින අනික් අයගේ කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් සලාක පොත් උගස් තැබීමේ බලය මේ පනතෙන් ගෘහ මූලිකයාට ලබා දෙනවා. හාල් සලාක පොත් උගස් තැබීමෙන් පසුව ණය ගෙවන්නට බැරි වන කරුණු නිසා ඒ උදවියට ආහාරයක් නොමැතිව තබාගැනීමට හැකි වන පරිදි මේ පනතෙන් විධිවිධාන සලස්වා තිබෙනවා. ඒ අනුව අද අනුගමනය කෙරෙන ප්‍රතිපත්තියත් මෙම පනතට එකතු වී තිබෙනවා.

අපේ රටේ දාරක මරණ අකාල මරණ වැඩි වේගෙන යන බව නම් වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සාක්ෂ්‍යවලින් පෙනී යන දෙයක්. අද නොයෙක් විධියේ අමුතු අසනීප බෝවේගෙන යනවා. ඊයේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අසන්නට යෙදුණා දැන් බෝවේගෙන යන අලුත් උණක් පිළිබඳ ප්‍රශ්නයක්. මා බොරැල්ලේ ළමා රෝහලේ විශේෂඥයකුගෙන් මේ ගැන කරුණු විමසුවා. අද පැතිරී යන මෙම උණ රෝගය නිසා මරණයට භාජනය වී සිටින අය එක්කෝ ළදරු අයය, එසේ නැත්නම් මහළු අයය කියා ඒ මහතා කිව්වා. මේ දෙකොටසටම ඒ සමිතිය මගින් ගොවීන්ට සතයකවත්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

සිදු වී ඇත්තේ මහළු අය ස්වභාවිකවම දුර්වලවීම නිසාත්, දරුවන්ට ඇති මන්දපෝෂණය නිසාත් බවට ඒ මහතාගෙන් අදහස් ප්‍රකාශ වුණා. ඒ විධියේ තත්ත්වයක් තිබියදී මුදල් ගෙවා ගන්නට බැරි කම නිසා කැපී ඇති සලාක ප්‍රමාණය සියයට 7.6 ක් කියා මහා බැංකුවෙන් පුරසාරම් දොඩනවා. ඒ සියයට 7.6 ට ඇතුළත් දරුවන්ගේ කුසගින්න නිවන්නට ඇති ආහාර මේ ආණ්ඩුව විසින් උදුරා ගත්තේ මොන විධියේ ප්‍රතිපත්තියක් අනුවද, මොන විධියේ චේතනාවක් උඩද කියා මා අහනවා. මන්දපෝෂණය පිළිබඳ ප්‍රශ්නය පවා විසඳා ගන්නට බැරිව සිටින අවධියක ගරු කෘෂිකර්ම ඇමතිතුමා, ණය ගෙවන්නට බැරි නම් දරුවා අනුභව කරන සහල් ටික වුවත් මා උදුරා ගන්නට ලැස්තියි කියා සතුටින් කියනවා නම්, මා ඒවා ලබාගෙන ආහාර දෙපාර්තමේන්තුව මාර්ගයෙන් මහජන බැංකුවට භාර දෙන්නට ලැස්තියි කියා සතුටින් කියනවා නම්, එතුමා සාමාන්‍යයෙන් හොඳ හිත ඇති මනුස්සයකු වුවත් මෙය එතුමාගේ එක්තරා අමනුස්ස ප්‍රතිපත්තියකැයි අපට හෙළා දකින්නට වෙනවා.

මා මීට වඩා මේ ගැන කතා කරන්නට යන්නේ නැහැ. මෙම පනතෙහි තිබෙන අනිකුත් කොටස් ගැන විස්තර වශයෙන් අනික් මන්ත්‍රීතුමන්ලා කතා කරනවා ඇති. යටගියාවේදී කරපු වැඩක් නීත්‍යනුකූල නොවේය යන සැකය මතු වී තිබෙන හෙයින් අද මෙම සභාවේද කැමැත්ත ඇතුව පනතක් සම්මත කරගනිමින් එහි යුක්තිසහගත බවක් ඔප්පු කරන්නට කතා කරන බවයි පෙනෙන්නේ. එම නීති විරෝධි වැඩය නීත්‍යනුකූල කර ගන්නටයි ඇමතිතුමා උත්සාහ දරන්නේ. ගරු සභාපතිතුමා මාර්ගයෙන් මා කියන්නේ ගැමියාගේ දරිද්‍ර භාවය පිළිබඳව නොසලකා ණය මුදලක් එකතු කර ගැනීමේ ප්‍රධාන පරමාර්ථය ඇතුව, මන්දපෝෂණයෙන් පෙලෙන ගැමි ජනතාවගේ ආහාරයට තර්ජනයක් වන පරිද්දෙන් ඉදිරිපත් කර ඇති මේ පනතට මෙම වෙසක් උත්සව සමය කිට්ටු වේගන එන කාලයේදී මනුස්සකමකින් යුතුව මෛත්‍රියක් හිතේ තියාගෙන පිරිසිදු චේතනාවක් ඇතුව ඡන්දය දෙන්නට බැරි බවයි.

අ. භා. 2.24

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මයා** (බිබිලෙ)

*(திரு. ஆர். எம். தர்மதாச—பிபிலை)*

(Mr. R. M. Dharmadasa Banda—Bibile)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර සමිති (විශෙෂ විධිවිධාන) පනත් කෙටුම්පත යටතේ වචන සවල්පයක් කතා කරන්නට අවසර ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ රටේ අළුත් ණය දීමේ ක්‍රමය යටතේ වගා ව්‍යාපාරය ආරම්භ කළාට පසු එය ව්‍යාප්ත කොට නීතිගත කිරීම සඳහායි මෙම පනත ඉදිරිපත් කරන්නේ. මෙම වගා ව්‍යාපාරය ආරම්භ කරන විට ලංකාවේ සමුපකාර සමිතිවලට බැඳී එම සමිති මාර්ගයෙන් ගොවිතැන් සඳහා ණය ගත් විශාල සංඛ්‍යාවක් ගොවි ජන සේවා කොමසාරිස්තුමාට ණය වී සිටියා. පළමුවෙන්ම මෙම රජය ඔවුන් එම ණයබරින් මිදෙව්වා. මට මතක හැටියට කෝටි හතහමාරක් පමණ කපා හැරියා. එසේ කොට ඔවුන් සම්පූර්ණයෙන් නිදහස් කර අළුත් සාමාජිකයන් හැටියට නැවතත් එම සමිතිවලින් ණය ලබා ගැනීමට පහසුකම් සැලැස්සුවා. ඒ කාලයේ ණය අය කර ගැනීමට තිබුණු අපහසුකම් නිසා හා ණය අය කර ගැනීමට දැරූ උනන්දුව මදි නිසා 1958 සහ 1959 වර්ෂවලට එන විට සමුපකාර සමිතිවලින් ලබාගෙන නොගෙවා තිබුණු ණය කෝටි හතහමාරක් පමණ වෙනවා. නීතියෙන් පවා එම ණය අය කර ගැනීමට අපහසු වුණා. ඒ ගැන සමුපකාර සමිතිවලින් වුවත් වැඩිපුර උනන්දුවක් නොදැක්වූ නිසා ණය ලබාගෙන නොගෙවා සිටින්නට තිබෙන එකම ස්ථානය සමුපකාර සමිතිය බවට පිළිගැනීමක්ද තිබුණා. මෙම තත්ත්වය නැති කර පහසුවෙන් ණයක් ලබාගෙන ගොවිතැන් කිරීමට ගොවීන්ට ඉඩකඩ සැලසීම සඳහා මෙසේ කටයුතු කළා. එදා අක්කරයකට රුපියල් 175 යි දුන්නේ. අද රුපියල් 260 දක්වා—අයි. ආර්. 8 ට නම් රුපියල් 320 දක්වා—ණය දීම වැඩි කර තිබෙනවා. අප දන්නවා පරණ ක්‍රමය යටතේ ණය ආපසු ලබාගැනීමේ අපහසු තත්ත්වයක් තිබුණු බව. ණය දීම මෙන්ම ආපසු ලබාගැනීමේ ක්‍රමයක්ද ඇති කළ යුතු නිසා, එසේ ගෙවීම පැහැර හරින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුද්ගලයින්ට නොමිලයේ දෙන සහල් සලාකය ආපසු ගැනීමේ ක්‍රමයක් ආරම්භ කර තිබෙනවා. එය නීතිගත කිරීම සඳහායි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ. මෙය රජයෙන් නිකම් දෙන දෙයක් ආපසු ලබා ගැනීම සඳහා මිස ගොවියාගේ සාක්කුවේ තිබෙන දෙයක් උදුරා ගැනීම සඳහා සකස් කළ ක්‍රමයක් නොවෙයි. සමිතියක මාර්ගයෙන් බැංකුවෙන් ණය ලබාගෙන එම ණය මුදල් ආපසු ගෙවන්නේ නැති නම් රජයෙන් නොමිලයේ දුන් සහල් සලාකය කපා හැරීම පමණයි මෙයින් කරන්නේ. මෙය ගොවියාට කිසිදු කරදරයක් නොකර ණය ආපසු ලබාගැනීමේ ක්‍රමයක් බව මතක් කරන්න කැමතියි.

ඇත්ත වශයෙන්ම යම්කිසි ව්‍යාපාරයක් ආරම්භ කර ක්‍රියාත්මක කරන විට යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මෙයට පෙර ගොවීන්ට ණය මුදල් ලබාදීමේදී සමිතිවලට නොයෙකුත් කරදර වලට මුහුණ දෙන්න සිද්ධ වුණා. විටින් විට චක්‍ර ලේඛන වෙනස් කළා. පළමුවෙන්ම රුපියල් එකසිය හැත්තෑපහක් ලබා දීම සඳහා තිබුණු චක්‍ර ලේඛය පසුව වෙනස් කළා. අයි. ආර්. 8 ට ඊට වඩා ගන්නට පුළුවන්ය කියා වෙනස් කිරීම නිසා ගොවියාට සෑහෙන අපහසුකම්වලට මුහුණ පාන්න සිද්ධ වුණා.

එපමණක් නොවෙයි, සමහර සමිති, ඒවායේ සාමාජිකයන්ගේ නම්වලින් බැංකුවෙන් මුදල් ලබාගත්තත්, සාමාජිකයන් එම මුදල සම්පූර්ණයෙන්ම ලබා නොගත් අවස්ථා තිබෙනවා. එසේ ලබා නොගන්නා මුදල් සමිතියේ ඉතුරු වෙනවා. ගොවියා පළමුවෙන්ම ඇප ඔප්පුවකට අත්සන් කරන විට සීසෑම, පෝර දැමීම, කෘමි නාශක බෙහෙත් ලබාගැනීම, පැල සිටුවීම ආදී සෑම අංශයක් සඳහාම මුදල් ලබාගැනීමේ ගිවිසුමකට බැඳෙනවා. එසේ වුණත් ඒ සෑම කටයුත්තක් සඳහාම මුදල් නොගන්නා අවසථා තිබෙනවා. ඒ මුදල් සමිතියේ ඉතුරු වෙනවා. එම නිසා මේ අන්දමට ගිවිසුම් අත්සන් තැබීමෙහි වෙනසක් කළ යුතුය කියා මා අදහස් කරනවා. මන්ද? සමහර සමිතිවලට මේ නිසා යම් යම් දූෂණ කරන්න අවකාශ ලැබෙන නිසයි. සීසෑම සඳහා ණය ලබා ගන්නා අවස්ථාවේදී අනිකුත් කාර්යයන් සඳහාත් ණය ගැනීමට ගිවිසුමට අත්සන් තබනවා. එහෙත් කෘමිනාශක බෙහෙත් ද්‍රව්‍ය ලබාගැනීම ආදිය සඳහා සියලු දෙනාම ණය ලබාගන්නේ නැති නිසා මුදල් සමිතියේ ඉතුරු වෙනවා. සමිතියේ එසේ ඉතුරුවන මුදල් සමහර අවස්ථාවලදී නොයෙකුත් ව්‍යාපාර සඳහා යොදවනවා. අපේ ප්‍රදේශයේ තිබෙන එක් සමිතියක්—අවශ්‍ය නම් මම නම් වශයෙන් කියන්නම්—එසේ ඉතුරුවන ණය මුදල්වලින් රෙදි විකිණීමේ අංශයක් විවෘත කර තිබෙනවා. එම අංශයට රෙදි ලබාගත්තේත් සමුපකාර සංගමයකින් හෝ සලුසලෙන් නොවෙයි, පෞද්ගලික ආයතනයකින්. එසේ ආරම්භ කළ අංශය විවෘත කරවනු ලැබුවේ උපකොමසාරිස් වරයා ලවායි. ගොවියන් ලබා නොගෙන සමිතිවල ඉතුරු වූ ණය මුදල් ආපසු බැංකුවට නොදීමෙන් එම සමිතිය වරදක් කර තිබෙනවා. එපමණක් නොවෙයි, එම මුදල් ලබා ගෙන ඇත්තේද ගොවියන්ගේ නම්වලිනුයි.

මෙහිදී ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළයුතු කාරණයක් තිබෙනවා. ගොවියන්ගේ නම්වලින් බැංකුවෙන් ණය ලබාගන්නා විට එම ණය මුදල් ගොවියා අතට යනවාද, එයින් නියම ප්‍රයෝජනයක් ලබා ගෙන තිබෙනවාද කියන කාරණා ගැන සොයා බැලීම වැදගත් බව මතක් කරන්න කැමතියි. එසේ නොකළොත් ඒ නිසා අසරණ ගොවීන් අමාරුවේ වැටෙන්න පුළුවනි. සමහර විට ගොවියකුට එවැනි දෙයක් නිසා අසාධාරණයක් සිදු වුණොත්, ඒ පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කළත් විභාග කර තීරණයක් ගැනීම බොහෝ ප්‍රමාද වෙනවා. විශේෂයෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුවේ තීරක නඩුවලදීයි මේවා සම්බන්ධයෙන්—සමිති නිලධාරීන්ට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන්—තීරණයන් ගන්නේ. සමහර විට තීරණයක් ගැනීමට අවුරුදු හත අටක් පවා ගත වන අවස්ථා තිබෙනවා. මේ නිසා අහිංසක ගොවියන්ට අපහසුකම්වලට මුහුණ දෙන්න වෙනවා.

එසේ වුණත් යම් අවස්ථාවක වගාව පාළු වී ගියහොත්, අස්වැන්න නොලැබී ගියහොත්, ඒ ගොවියා විසින් ගෙවිය යුතුව තිබෙන ණය මුදල ආපසු ගෙවීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

දවස් 210 ක් කල් දීමට දිසාපතිතුමාට බලතල තිබෙනවා. එවැනි වගා පාළු වූ අයට ඒ ණය ගෙවා ගැනීමට හැකි වන පරිද්දෙන් ඊළඟ වගාව සඳහා නැවත ණය දීමට දිසාපතිතුමාත් සමුපකාර දෙපාර්තමේන්තුවත් මහන්සි ගන්නවා. එහෙත් අවාසනාවකට මෙන් දිසාපතිතුමාත්, සමුපකාර දෙපාර්තමේන්තුවත් අනුමත කර තිබෙන මේ කටයුත්ත කිරීමට සමුපකාර පරීක්ෂකවරුන් සහ ඇතැම් විට සමුපකාර සහකාර කොමසාරිස්වරුන් මැළිකමක් දක්වනවා. ඒ නිසා ගොවියන්ට ලොකු කරදරයකට මුහුණ පාන්නට සිදු වෙනවා. දෙවැනි වතාවේ ගොවිතැන් කොට දෙවතාවේම ණය එක වර ගෙවීමට තිබෙන අවස්ථාව මෙයින් නැති වී යනවා. සමහර විට පෞද්ගලික වෙළෙඳුන්ගෙන් වැඩි පොලියකට ණය ලබා ගන්නට ඒ ගොවීන් පෙළඹෙනවා. දෙවැනි වතාවේ ණය නොදෙනවා පමණක් නොව ඇතැම් විට වගා පාළුවක් සිදු වී ඇතත් හාල් පොත් ටිකත් රජයට දෙන්නට ගොවීන්ට සිදු වෙනවා.

පසුගියදා සියඹලාණ්ඩුව ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම වගා පාළුවක් ඇති වුණා. දෙවැනි වතාව සඳහා වගා ණය දෙන්නට සමුපකාර සහකාර කොමසාරිස්තුමා කැමති වුණේ නැහැ. ඒ අතර දවස් 210ක් සම්පූර්ණ වීමෙන් පසුව ඒ ගොවීන්ගේ හාල් පොත් ටික ආපසු දෙන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. දෙවැනි වතාවේ වගාව සඳහා ණය නොදෙන කොට පෞද්ගලික වෙළෙඳුන්ගෙන් ඒ සමහර ගොවියන් ණය ගන්නේ වී බුසල රුපියල් හත නැත්නම් අට බැගින් ඔවුන්ට දීමට පොරොන්දු වෙමිනුයි. මෙවැනි අපරාධවලට අහිංසක ගොවියන් ගොදුරු වන්නේ සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරි හැටි වැඩ නොකරන නිසයි.

විවිධ සේවා සමුපකාර සමිතියකින් ණය දුන්නායින් පසුව ඒවා ආපසු ලබා ගන්නේ ගොවීන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය ඒ සමිතියට විකුණන විටයි. විශේෂයෙන් වී නිපදවන ගොවීන් ඒ වී රජයට දී බුසලකට රුපියල් 14 බැගින් ලබා ගන්නට ලොකු ආශාවක් දක්වනවා. ගොවීන්ගේ වී මිළ දී ගැනීමට සමුපකාර සමිතිවලට පහසුකම් තිබිය යුතුයි. සමහර සමුපකාර සමිතිවලට සමහර අවස්ථාවලදී වී මිළ දී ගැනීමට මුදල් නොමැති වුවහොත් පිට අයට වී විකුණන්නට ගොවීන්ට සිදු වෙනවා. මේ තත්ත්වය වැළැක්වීම සඳහා සෑම සමුපකාර සමිතියකටම බැංකුවලින් ණය ලබා ගැනීමට පහසුකම් සලසා දිය යුතුයි. සමහර සමුපකාර සමිතිවලට ණය දීම සමුපකාර සහකාර කොමසාරිස්වරුන් අනුමත කරන්නේ නැහැ. එවිට සිදු වන්නේ ඒ සමිතිවලට වී මිළ දී ගන්නට නොහැකි වීමයි. සමුපකාර සමිති වී මිළ දී නොගන්නා විට පෞද්ගලික වෙළෙඳුන් ඒ වී මිළ දී ගෙන ප්‍රදේශයෙන් පිට පෞද්ගලික මෝල්වලට විකුණනවා. මේ නිසා රජයට වී මිළ දී ගන්නට තිබෙන අවස්ථාව නැතිව යනවා. ඒ වාගේම ගොවියන්ට දී තිබෙන ණය ආපසු ලබා ගන්නට අවස්ථාව නැතිව යනවා. සමුපකාර සහකාර කොමසාරිස්වරුන් මේ අන්දමට කටයුතු කරනවා නම් භයානක තත්ත්වයකට මුහුණ පාන්නටයි, සිදු වන්නේ.

බිබිලේ ප්‍රදේශයේ එක සමුපකාර සමිතියක් ගොවියන්ට රුපියල් 8,000ක් ණයට දී ඇතත් මේ වර වී මිළ දී ගැනීමේ නියෝජිත ධුරය ඒ සමිතියට ලැබී නැහැ. ඒ සමිතියට හැතැප්ම 10ක් පමණ ඈතින් ඇති වෙනත් සමිතියකටයි, නියෝජිත ධුරය දී තිබෙන්නේ. මේ නිසා ගොවීන්ට දී තිබෙන ණය ආපසු ලබා ගන්නට අර සමිතියට පුළුවන්කමක් නැහැ. එතකොට ඒ අහිංසක ගොවියන්ගේ හාල් පොත් ටික රජයට ගන්නට සිදු වෙනවා. ඈත· තිබෙන සමිතියෙහි මේ ගොවීන්ගේ නම් සටහන් වන්නේ නැහැ. ගිහිල්ලා වී ටික භාර දී සල්ලි අතට ගන්නවා. නමුත් අර සමිතියට ණය හිඟ සිටිනවා. ඒ නිසා අවසානයේදී සිදු වන්නේ ගොවියාගේ හාල් පොත් ටික රජයට ගෙන ඒවා පියවා ගන්ටයි. මෙවැනි වැරදිවලට සම්පූර්ණයෙන්ම වැරදිකරුවන් වන්නේ දෙපාර්තමේන්තු නිලධාරීනුයි. මා විශේෂයෙන් මතක් කරන්නේ මගේ ප්‍රදේශයේ සමිතිවල මෙවැනි අඩුපාඩුකම් තිබෙන නිසයි. මේ වගේ අඩුපාඩුකම් තිබීම මගේ ප්‍රදේශයට පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවෙයි, මුළු ලංකාවටම බල පාන්න පුළුවනි. නිලධාරීන් අතින් මෙවැනි දූර්වල කම් සිදු වෙනවා නම්, ණයක් දුන්න සමිතියකට වී මැන ගැනීමට අවසර දෙන්නේ නැති නම්, එම ණය ගැනීමට සමිතියට තිබෙන අවස්ථාවක් නැතිව යනවා. අවසානයේදී ගොවියාගේ හාල් පොත් ටික රජයට භාර ගැනීමෙන් සිදු වන්නේ කොයි තරම් ලොකු අපරාධයක්ද ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොයි තරම් බලකළත් සමහර සමිති ගොවියන්ට ණයදීමට ඉදිරිපත් වන්නේ නැහැ. මේ කාරණය ගැනත් අප සොයා බැලිය යුතුයි. උදාහරණයක් වශයෙන් අපේ ප්‍රදේශයේ තිබෙන ලුනුගල විවිධ සේවා සමුපකාර සමිතිය ගැන කියන්න පුළුවනි. එම සමිතියෙන් එක සතයක්වත් ණය වශයෙන් පසුගිය අවුරුද්දේ ගොවීන්ට දී නැහැ. ඒ අවට අක්කර 200 ක පමණ වී වගාවක් කෙරෙන නමුත් එම සමුපකාර සමිතිය මගින් ගොවීන්ට සතයකවත් ණය මුදලක් පසුගිය වර්ෂයටම ලබා දී නැහැ. මා දන්නේ නැහැ මොන හේතුවක් නිසා ඒ විධියේ දෙයක් වුණාද කියා. කෙසේ වුණත් අද වන තෙක් එම සමිතියෙන් සතයක වත් ණය මුදලක් ගොවීන්ට දී නැහැ. එසේ ණය ලබා නොදීම නිසා ඒ ගොවීන්ට සිදු වුණා ඔවුන් නිපදවන වී බුසල රුපියල් 8 බැගින් නැත්නම් රු. 10 බැගින් විකිණීමට. එයට හේතුව ඒ ගොවියන් ගොවිතැන් කළේ පුද්ගලික වෙළඳුන්ගෙන් ණය මුදල් ලබා ගැනීමෙනුයි. සමිතියෙන් ණය මුදල් නොදෙන නිසා පෞද්ගලික වෙළඳුන්ගෙන් ණය ලබා ගැනීමට ඔවුන්ට සිදු වුණා. ඇතැම් ප්‍රදේශවලට රජයෙන් ණය මුදල් දීමේ පහසුකම් සියල්ලම තිබුණත් සමහර සමිතිවලින් නම් එය ක්‍රියාත්මක වන්නේ නැහැ. මා දැන් ඉදිරිපත් කළ ලුනුගල විවිධසේවා සමුපකාර සමිතිය උදාහරණයක් වශයෙන් දක්වන්න පුළුවනි. එම සමිතියෙන් පසුගිය අවුරුද්ද ඇතුළත එකම සතයක්වත් ණය වශයෙන් දී නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙසේ සමිතිවලින් ණය දෙන අතරතුරේ ගොවියන්ගෙන් වී මිළ දී ගන්න සමිතිවලට බුසලකට ශත 60 ක් වන සේ කොමිස් මුදලක් ගෙවනවා. ඊළඟට අලුත් ක්‍රමයක් අනුව ගිය අවුරුද්දට වඩා වැඩි ප්‍රමාණයක් මේ කන්නයේදී වී මිළ දී ගත් විට ඒ වැඩියෙන් ගත් හැම බුසලක් සඳහාම වැඩිපුර ශත 20 ක කොමිස් මුදලක් ද දී තිබෙනවා. ඒ වැඩි වන හැම බුසලකටම ඒ අනුව ශත 80 ක කොමිස් මුදලක් දී තිබෙනවා. මේ අන්දමට සමහර සමිතිවලින් කන්න දෙකටම එක අවුරුද්දක් ඇතුළත වී බුසල් 40,000 ක් 50,000 ක් පමණ ගෙන තිබෙනවා. ඒ අනුව එම සමිතිවලට ඒ මගින් කොමිස් මුදල් වශයෙන් අවුරුද්දට රුපියල් 30,000 ක පමණ මුදලක් ලැබෙනවා. නමුත් අවුරුද්දට රු. 20,000 ක් 30,000 ක් පමණ වීවලින් පමණක් ලබා ගන්න සමිති මාස 3 ක් 4 ක් ඇතුළත බංකොලොත් වෙනවා. ඒ සමිති ඒ විධියට බංකොලොත් වෙන්නේ මොන හේතුවක් නිසාද කියා තව මත් නිලධාරීන් ගොස් සොයා බලා නැහැ. වීවලින් පමණක් නොව, මේ සමිති පොහොරවලින්, කෘමිනාශක බෙහෙත්වලින්, ණය මුදල් දීමෙන් ලැබෙන පොළී මුදලින්—සමහර විට ශත ගණනක් හෝ ඒ මගින් ලැබෙන්න පුළුවනි—යනාදී මාර්ගයන් ගෙන් ලැබෙන ආදායම් ගැන නොසලකා වී අංශයෙන් පමණක් රු. 20,000 ක්, 30,000 ක්, 40,000 ක් පමණ ලබන සමිති මාස දෙක තුනක් ඇතුළත බංකොලොත් වන්නේ මොන හේතුවක් නිසා ද කියා සොයා බැලිය යුතුයි. මා දන්නවා ඒ තරමේ ආදායමක් ලැබූ සමිති බංකොලොත් භාවයට පත් වීම නිසා ළඟ තිබෙන වෙනත් සමිතියකට එහි පාලනය පවා භාර දී තිබෙන බව.

මෙවැනි සමිතියක් ගැන සොයා බලන්නය කියා නිලධාරීන්ට ටෙලිග්‍රෑම් පිට ටෙලිග්‍රෑම් යැව්වත් කිසිම කෙනෙක් පැමිණ නැහැ. විශේෂයෙන්ම පැලවත්ත විවිධ සේවා සමුපකාර සමිතිය එවැනි සමිතියක්. වීවලින් පමණක් ඒ සමිතියට අවුරුද්දකට රු. 30,000 ක්, 40,000ක් පමණ එනවා. නමුත් එය බංකොලොත් වුණා. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට සමුපකාර උප කොමසාරිස්තුමාට එන්නය කියා නිලධාරීන් ගොස් කිව්වත් එතුමා පැමිණියේ නැහැ. මේ සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාට පුද්ගලිකව දැනුම් දුන් විට එදින සවසම උප කොමසාරිස්තුමා යවන්න පොරොන්දු වුණත්, අද වන තෙක් ගියේ නැහැ. එසේ නොගියත් ඒ සඳහා ගමන් ගාස්තු ගත් බවක් නම් මට ආරංචියි. එම ආරංචිය ඇත්තක්ද නැද්ද කියා නම් මා දන්නේ නැහැ. ආරංචි අනුවයි මා කියන්නෙ. ගරු ඇමතිතුමා විසින් කිව්වත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්නය කියා එය මෙතෙක් කෙරුණේ නැහැ. මෙවැනි නිලධාරීන් සිටින්නේ මොනරාගල පළාතට පමණක් ද කියා මා දන්නේ නැහැ. නමුත් මෙවැනි නිලධාරීන් ස්වල්පයක් සිටියොත් මේ සමිති ක්‍රමය සම්පූර්ණයෙන් අඩපණ කරන්නටත්, ණය ක්‍රමය නිසා ගොවීන් අමාරුවේ දමන්නටත් පුළුවන් වෙනවාට සැකයක් නැහැ. ඒ නිසා ණය ක්‍රමය මේ විධියට ආරම්භ කර ගොවියාගේ සලාක පොත් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් විකක් සොයා බලන්නට වැඩ කටයුතු කරනවා ඇතැයි මා විශ්වාස කරනවා. නිලධාරීන්ගේ දුර්වලතාවන් නිසා දුප්පත් ජනයා කරදරයට වැටෙන අවස්ථා නැති කිරීමට විධිවිධාන සැලසීම අවශ්‍යයි. මෙවැනි අවිහිරකම් ඇති වන්නට ඉඩ නොතබා කටයුතු කරන්නට තරම් දක්ෂ නිලධාරීන් මේ කටයුතු සඳහා නියම අන්දමට යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. ඉතාම දුෂ්කර ප්‍රදේශයක් වන මොනරාගල ප්‍රදේශයට හොඳ නිලධාරීන් එවීමට විශේෂ සැලකිල්ලක් දක්වනවා නම් හොඳයි. ගරු ඇමතිතුමා පසුගිය මාසයේදී මොනරාගලට ගිය අවස්ථාවේදී ප්‍රකාශ කළා කිසිම දැනුමක් තේරුමක් නැති උප කොමසාරිස්වරයකු ඒ ප්‍රදේශයට යවා තිබෙන බව. ඒ නිලධාරියාට තවමත් ප්‍රදේශය තුළ ඇවිදගන්නටවත් බැරි වෙලයි තිබෙන්නේ. ඒ නිසා මොනරාගලට හොඳ දැනුම් තේරුම් ඇති නිලධාරීන්ම එවන ලෙස නැවතත් වරක් මතක් කරමින් මා ඉදිරිපත් කළ දේවල් සැලකිල්ලට භාජන කොට, දුර්වලතාවන් මඟ හැරවීමට කටයුතු කරනු ඇතැයි විශ්වාස කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව නවත්වනවා.

අ. භා. 2.44

**එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)**

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්බද ප්‍රදේශවල ජීවත් වන ගොවි ජනතාවගේ තත්ත්වය නඟා සිටුවීමට කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා උත්සාහ දැරීම ගැන අපට සන්තෝෂ වන්නට පුළුවනි. ඒ ගැන අපි එතුමාට අපේ සුබ පැතුම් පිරිනමනවා. එහෙත් මේ කටයුත්ත ගැන නම් අපට කියන්නට තිබෙන්නේ හරියට ලෙඩක් වැළඳුණු දරුවකුට දොස්තර මහත්මයකු නැත්නම් වෛද්‍යවරයකු දුන් බෙහෙත් වට්ටෝරුව අනුව බෙහෙත් දීමෙන් පසු ඒ දරුවා මළාට පස්සේ වෙද බේරා ගන්නට සිතා ඒ බෙහෙත නීත්‍යනුකූල එකක් බවත්, හරි බෙහෙතක් බවක් කියා ඒ කියමන සනාථ කරන්නට දරන තැනත් හැටියට අපට පෙනෙන බවයි. මට නම් මෙයින් පෙනී යන්නේ ගරු ඇමතිතුමා ලෙඩ දරුවා මරලා, ලෙඩාට දී තිබෙන්නේ වැරදි බෙහෙතක් බවත් පිළිගෙන, ඊළඟට ඒ වැරදි බෙහෙත හරි බෙහෙතකැයි ඒත්තු ගන්වා තවත් දරුවන් මරා දමන්නට කරන තැනක් වගෙයි. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් එක් ඉල්ලීමක් කරන්නට කැමතියි. ණය මුදල් අයකර ගැනීමට ප්‍රතිකර්මයක් හැටියට මේ බෙහෙත දෙන්නට සිද්ධ වුණේ ඇයි දැයි සොයා බලා, ලෙඩේ වැළැඳීමට හේතුවත් කල්පනාවට භාජන කර, හරි බෙහෙතක් හොඳ වෙදකුගේ මාර්ගයෙන් ලබා දීමට ගරු ඇමතිතුමා කටයුතු සලස්වා දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

ගොවි ණය ගැන කල්පනා කර බැලුවොත්, අපට පෙනී යන කාරණයක් තමයි අවුරුද්දෙන් අවුරුද්ද ගොවියාගේ ණය බර වැඩි වන බව. ගොවිජන සේවා කොමසාරිස්වරයා විසින් 1965-66 වර්ෂය සඳහා නිකුත් කරන ලද පාලන වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඊට පසු අවුරුද්දක් වෙනුවෙන් නිකුත් කරන ලද වාර්තාවක් මා ළඟ නැහැ. එහෙත් ප්‍රශ්නයට අදාළ කරුණු දැන ගැනීමට මේ වාතීාව ඉවහල් වෙනවා යයි මම කල්පනා කරනවා. මෙය කියවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැලුවොත් ගරු ඇමතිතුමාට නියම තත්වය සම්පූර්ණයෙන්ම අවබෝධ වෙනවා ඇති. වාර්තාවේ 5 වැනි පිටුවේ මෙන්න මේ අන්දමට සඳහන් වෙනවා :

"කෘෂිකාර්මික කාර්යයන් සඳහා ප්‍රථමයෙන් ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව මගිනුත්, ඊට පසුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගිනුත් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමය ආරම්භයේ දී සිට වාර්ෂිකව දෙන ලද ණය—"

ඔය ආදි වශයෙන් සඳහන් කර ඊළඟට වාර්ෂිකව දෙන ලද ණය මුදල් ප්‍රමාණය සඳහන් කර තිබෙනවා. වර්ෂයක් දෙකක් පමණක් සඳහා දී තිබෙන සංඛ්‍යා ලේඛන කියවා බැලුවත් ඇති. කාරණය අවබෝධ කර ගැනීමට ඉවහල් වන ප්‍රමාණයට පමණක් ඉලක්කම් ඉදිරිපත් කරන්නම්. 1947-48 දෙන ලද ණය ප්‍රමාණය රු. 43,54,000 කැයි කියනවා. එයින් අය කර ගත් ණය රු. 25,49,000ක් බවත් කියැවෙනවා. ලැබීමට ඇති ඉතිරිය 18,12,000යි. ඔය විධියට මේ වාර්තාවේ තිබෙනවා. ඊළඟට 1965-66 දෙන ලද ණය ගැන බලමු. ඒ වසියේදී දෙන ලද ණය 2,81,38,000 යි. අය කර ගත් මුදල 2,13,24,000 යි. ලැබීමට ඇති ඉතිරිය 6,10,52,000 යි.

මෙයින් අපට කරුණු දෙකක් පැහැදිලි වෙනවා. එකක් නම් ණය ඉල්ලුම වැඩිවී තිබීමයි. මේ සියලුම ණය කුඹුරු ගොවිතැන සඳහා බව, වී නිෂ්පාදනය වැඩි කිරීම සඳහා බව අප දන්නවා. ණය දීම පිළිබඳව නව යෝජනා ක්‍රමයකුත් පිළියෙළ කර මේ සියලුම කටයුතු කරන්නේ කුඹුරු ගොවියාට ණය සහනාධාර දීමේ ප්‍රතිපත්ති උඩයි. එසේ නම් දැන් ගම්බද කුඹුරු ගොවිතැන් කරන ගොවියා වැඩියෙන් ණය ඉල්ලන්නට වැඩියෙන් ණය ලබා ගන්නට පුරුදු වී සිටින බව පෙනෙනවා. ඒවාගේම ලබා ගන්නා ණය හුඟක් අඩුවෙන් ආපසු ගෙවීමේ තත්ත්වයකට ගොවියා පරිවර්තනය වී තිබෙන බවත් අපට පෙනෙනවා. මේ අවස්ථාවේදී අප එක් කාරණයක් සිහි තබා ගත යුතුයි. විශේෂයෙන්ම ගම්බද ගොවියා ණයට බොහොම භය කෙනෙක්. අර පරණ තත්ත්වය වෙනස් වී ක්‍රමයෙන් අළුත් තත්ත්වයකට පෙරළෙන ස්වභාවයක් තිබෙනවා තමයි. නමුත් සාමාන්‍යයෙන් අපේ ගම්බද ගොවියා ණය ගත්තාට ණයට බැඳී සිටින්නට එතරම් කැමැත්තක් දක්වන්නේ නැහැ. ගත් ණයක් තිබෙනවා නම් ඒ ණයෙන් හැකි තරම් ඉක්මණින් මිදීමේ ස්වභාවයයි අපේ ගම්වල ගොවීන් තුළ තිබෙන්නෙ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒ ඉස්සර.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

බොහොම ඉස්සර කීවත් වැරදියි. ගරු ඇමතිතුමාගේ ගමේත් අපේ ගම්වලත් සිටින ගොවීන් ණයට භය බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. තත්ත්වය එසේ වුවත් දැන් ණය ගැනීම ඕනෑවට වඩා අවශ්‍ය වී තිබෙනව. ඒක එක් කාරණයක්. ණය ගැනීම ඕනෑවට වඩා අවශ්‍ය වී තිබෙනවාත් සමගම ඒ ණය ආපසු ගෙවීමට කොයි තරම් ඕනෑකමක්, ආශාවක් තිබුණත් ණය ආපසු ගෙවීම අපහසු වී තිබෙනවා. ගත් ණය ආපසු ගෙවීමට පුළුවන්කම තිබියදීත් නොගෙවා සිටීමේ ගතිය ගම්වල බොහෝ දුරට අඩු බව මා කියන්නට සතුටුයි. නමුත් මෙතැන සිද්ධ වී තිබෙන්නේ කුමක්ද ? ණය මුදල් ආපසු ගෙවීමට කැමැත්ත තිබුණත් ගෙවීමට පුළුවන්කමක් නැහැ. ඒ කාරණය සනාථ කිරීම පිණිස මට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. අප මෑත යුගය ගැන කල්පනා කර බලමු. මෑත යුගයේ ගම්බද වැසියාගේ, ගම්බද ගොවියාගේ මුදල් ඉතිරි කිරීමේ තත්ත්වය ගැන කල්පනා කර බලමු. ගම්බද ගොවියා සතුව තිබෙන මුදල් ප්‍රමාණය, ඉතිරි කිරීමේ ප්‍රමාණය දවසින් දවසම අඩු වී තිබෙනවා. ඒ කාරණය මේ රජයෙන් නිකුත් කර තිබෙන 1968 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන්ම පෙන්වා දෙන්නට පුළුවනි.

"ඉකුත් වර්ෂ තුන ඇතුළතදී ග්‍රාමීය ඉතිරි කිරීමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී නොමැත."

ඒ අනුව ග්‍රාමීය ඉතිරි කිරීමේ තත්ත්වයෙහි, ගොවියාගේ ඉතිරි කිරීමේ තත්ත්වයෙහි වැඩිවීමක් වී නැහැ. එමනිසා තමයි මේ ණය ආපසු ගෙවීම පිළිබඳව ගොවියාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුෂ්කරතාවක් තිබෙන්නෙ. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ 145 වන පිටුවේ සඳහන් මේ කොටසින් ඒ කාරණය තවදුරටත් පැහැදිලි වෙනවා.

"ණය මුදල් ආපසු නොගෙවා පැහැර හැරීමේ ප්‍රධාන හේතුන් පහත සඳහන් අයුරින් දක්නට ලැබේ:—"

යනුවෙන් සඳහන් කරමින් කරුණු කීප යක්ම දක්වා තිබෙනවා. (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේදවලින් මා කිය වන්නේ (ඈ) ඡේදය පමණයි.

"වෙනත් ණයකරුවන් හට ණය වී සිටීමත්, ඔවුන් ඒවා ගොයම් කපා පාගා ගත් ස්ථානයේ දීම අය කර ගනු ලැබීමත් හේතුකොටගෙන සමුපකාර සමිතිවලට ගෙවීමට ප්‍රමාණවත් මුදලක් ගොවීන් අත ඉතිරි නොවේ."

මෙහි දී ණය ආපසු නොගෙවන ප්‍රධාන කරුණ හැටියට අපට සලකන්නට පුළුවන් වන්නේ මෙන්න මේ කරුණයි. අපට මෙහි දී පැහැදිලිව පෙනෙනවා, ගම්බද ගොවියාට මේ ණය වැළඳීමේ රෝගය දවසින් දවස උග්‍ර වී තිබෙන බව. දුන්න බෙහෙත නිසා රෝගියා මැරිලා. මේ පනතට කලින් රෙගුලසි යටතේ සලාක පොත් පවරා ගන්නට ගිය අවස්ථාවේ සමහර ගොවීන් තමන්ට තිබුණු ඉඩම් අක්කර 1/4 නැත් නම් 1/8 උගස් කර ණය ගෙවා පොත බේරා ගත් අවස්ථා තිබෙන බව ගරු ඇමති තුමා පිළිගන්නවා ඇති. එවැනි අවස්ථා එමට තිබෙනවා. ඒ නිසා අපි මේ ණය දීමේ දීත් ඒවා ආපසු ගැනීමේදීත් යන දෙකේදී ම වැඩියෙන් කල්පනා කළ යුතුව තිබෙන් නේ කුමක්ද? ණයක් දුන්නාම ඒ කට යුත්ත හරියාකාර කළාද නැද්ද කියන එක ප්‍රශ්නයක් හැටියට සලකා බලන්නේ නැහැ. එහෙත් එසේ දුන් මුදල් වලින් හරි යට ප්‍රයෝජන ගත්තේ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ, උඹේ අනිකුත් වත්කම් සියල්ලක්ම අපි පවරා ගන්නවා කියන එකයි මේ පනතින් කියන්නේ. එම නිසයි මා කියන්නේ ඇමතිතුමා, එනම් දරුවා රකින්නට සිටින පියා, කවුදෝ දුන් වසක් බෙහෙත් වට්ටෝරුවක්ය කියා දීලා දුන් එය අනුමත කරන්නටයි මේ හදන්නෙ කියා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රී තුමා කී පිළිවෙළට බැංකුවක පරමාර්ථය දුන් ණය අයකර ගැනීමයි. එහෙත් සමුප කාර සමිති කියන්නේ බැංකුවක්ම නොවෙයි. සමුපකාර සමිතිය ගොවියාට උදව් වීමේ මාර්ගයක්. ඒ නිසා අපි මේ අවස්ථාවේ දී සමුපකාර සමිතිවලින් අරගෙන තිබෙන ණය ගෙවීම පිණිස මේ ව්‍යවස්ථාව සම්පාදනය කරන්නට පෙර, මේ රෝගයේ නිධානය ගැන ටිකක් හිත් යොමු කරන් නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ණය දීමේ ක්‍රමය ගැන අපි ටිකක් කල්පනා කර බලමු. අපි අක්කරයකට රු. 262 ක ණයක් දෙනවාය කියා ඇමතිතුමා කියනවා. මේ මහ බැංකු වාර්තාවේ මෙන්න මෙහෙම තිබෙනවා:

"1968-69 මහ කන්නයේ සිට අක්කරයකට දෙනු ලබන ණය මුදල රු. 220 සිට රු. 262 දක්වා ඉහළ නැගෙන සේ ප්‍රතිශෝධනය කෙරුණි. පොහොර මිල හා ඕ සෑමේ ගාස්තු වැඩිවීම මෙම ප්‍රතිශෝධනයට අවස්ථානුරූපී විය."

අන්න ඒ කරුණයි අපි මෙහිදී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට භාජනය කළ යුතුව තිබෙන්නේ. අද ගම්බද ගොවියා තමන් වැඩ කර ගන්නාවූ කුඹුරු ප්‍රමාණයෙන් කොතරම් මුදලක් තමන් ළඟ ආරක්ෂා කර ගැනීම පිණිස තම ශ්‍රමය වැය කරනවාද කියන ප්‍රශ්නය එකක්. අනික තමන්ගේ නිශ්පාදන වලින් තමා යොදවන මුදලින් කොපමණ මුදලක් ආපසු ලැබෙයිද කොප මණ මුදලක් ඉතිරි වෙනවාද කියන එකයි. මේ කරුණු ගැන හිතන විට ගොවිතැන් කරනවාට වඩා මුදල් හදල් යොදා ගොවි තැන් කරන අර මැද තත්ත්වයේ සිටින තැනැත්තාට කුලී වැඩ කිරීම හොඳයි කියා අද ගම්බද ගොවියා තුළ වෙනස් වීමක් තිබෙනවා. එය භයානකයි. තමන්ගේ පොඩි කුඹුරේ ගොවිතැන් කරන්නට යාම නිසා තමන්ගේ සලාක පොතුත් රජයට දෙන්නට සිදු වන නිසා, ඒ කුඹුරු කැබලි උකස් කොට ඒවායේ ගොවිතැන් කරවීම සඳහා මුදලාලිලාට ඉඩ දී ඔවුන් යටතේ වැඩ කිරීම ඊට වඩා හොඳය කියා හිතන තත්ත්ව යට ඒ අනුව ක්‍රියා කරන තත්ත්වයට අද ගම්බද දුප්පත් ගොවියන් පත් වී තිබෙන නිසා එය ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන්නට කැමැතියි. ගොවියන් එබඳු තත්ත්වයකට පත් වීම ගැන ඇමතිතුමා කැමැති නොවන බව මා විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ තත්ත්වය වෙනස් කළ යුතුයි. ට්‍රැක්ටර් යොදවන්නට, අවශ්‍ය වේලාවට කුලී කරුවන් යොදවන්නට තරම් මුදල්-හදල් තිබෙන අයයි, අද ගොවියන් බවට පත් වී තිබෙන්නේ. වයඹ පළාතේ සත් කෝරළය විශාල වශයෙන් වී ගොවිතැන් කරන ප්‍රදේශයක් බව ඇමතිතුමා දන්නවා ඇති. ඒ ප්‍රදේශයේ අද ගොවියන් බොහොම අඩුයි. වැඩියක්ම ඉන්නේ, තමන්ගේම කුඹුරුවල වැඩ කරන ගොවියන්. දැන් ඇති වී තිබෙන තත්ත්වය නිසා ඔවුන්ටත් තමන්ගේම කුඹුරුවල වැඩ කිරීමට අපහසුකම් ඇති වී තිබෙනවා. ඒ අනෙකක් නිසා නොව, මා කලින් සඳහන් කළ දේවල් සඳහා යොදවන්නට තරම් ඔවුන් ළඟ මුදල්-හදල් නැති නිසයි.

තවත් වැදගත් කාරණයක් වී තිබෙන්නේ, ගොවිතැන කලට වේලාවට කළ යුතු එකක් වීමයි. කුඹුරු හෑමට සහ වී වැපිරීමට තිබෙන්නේ ඉතා සුළු කාල පරිච්ඡේදයක් පමණයි. ඒ සුළු කාල පරිච්ඡේදය තුළ ඒවා නොකෙරුණොත් ජල ගැලීම්වලින් හා නියංවලින් කුඹුරු පාළු වීමත්, නොයෙකුත් රෝග ගොයම්වලට වැළඳීමත්, සතුන්ගෙන් පැමිණෙන හානිත් නිසා ගොවියන්ට විශාල අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා. දැන් තිබෙන තත්ත්වය අනුව අද ඒ හැම විපතකටම ගම්බද අහිංසක දුප්පත් ගොවියන් ගොදුරු වී තිබෙනවා.

ඒ අහිංසක දුප්පත් ගොවියන්ට තමන්ගේ කුඹුරුවල හරියාකාරව වැඩ කිරීමට පහසුකම් ඇත්තේ නැහැ. ට්‍රැක්ටර් මුදලාලිලාට නම් දැන් බොහොම වාසියි. ගොවි ජනපදවල අනුන්ගේ කුඹුරු කොටස් පවා බදු අරගෙන මුදල්-හදල් තිබෙන අය ගොවිතැන් කරවනවා. එවැනි ගොවි මුදලාලිලාටයි, මේ විධිවිධානවලින් සහන ලැබී තිබෙන්නේ. දුන් ණය ආපසු ලබා ගැනීම සඳහා මෙසේ විධිවිධාන යෙදීමට කටයුතු කරන විට, එයින් පීඩනයට භාජන වන ගොවියන්ට ඔවුන් ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වන ආරක්ෂාව සැලසීම සඳහාත් කටයුතු සම්පාදනය කිරීම ඇමතිතුමාගේ යුතුකමක් බව පෙන්වා දෙන්න කැමතියි.

කුඹුරු ගොවිතැන් කරන බොහෝ ප්‍රදේශවල ජනයා තමන්ගේ ලෙඩට-දුකට, මඟුලට-ඉලව්වට හා අනෙකුත් සෑම දේකටමත් අවශ්‍ය මුදල් බලාපොරොත්තු වන්නේ කුඹුරු ගොවිතැනින් ලැබෙන වී අස්වැන්නෙන් බව ඇමතිතුමා දන්නවා ඇති. ගමේ ආර්ථික තත්ත්වය එය නම්, ගැමියාට කරන්නට තිබෙන්නා වූ සෑම වියදමක්ම පිරිමසා ගන්නට තිබෙන්නේ ඔහුට ලැබෙන වී ටිකෙන් නම්, එය ඔහුගේ අතේ රැදෙන විධියට ලබා නොදෙතොත් අපේ ගැමි ජනතාවගේ තත්ත්වය සතුටුදායක වන්නේ කෙසේද යන්න ගරු ඇමතිතුමාගේ කල්පනාවට භාජනය විය යුතුයි. මේ පරිහානි තත්ත්වය මේ අසාධ්‍ය තත්ත්වය තව ඉදිරියටත් යන්නට ඉඩ නොදී ගැමි ජනතාව මේ තත්ත්වයෙන් මුදවා ඔහු ආරක්ෂා කර ගැනීමේ වැදගත් යුතුකමක්, ගොවිතැනත් සමුපකාරයත් යන අංශ දෙකම භාරව සිටින ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙනවා. එම නිසා, ගම්බද ගොවියා ගත් ණය ඔහුගෙන් අය කර ගන්නවාට වඩා ඔහුට ණය නොවී සිටීමට කටයුතු සම්පාදනය කර දෙන ලෙසයි අප මේ වේලාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. ගම්බද ගොවියාගේ ණය බර තත්ත්වය ක්‍රමයෙන් අඩු කිරීමට කටයුතු කිරීම වැදගත් යුතුකමක්.

අද ගම්බද ගොවියාට පාවිච්චි කරන්නට සිදු වන උපකරණ දෙස බලන විට, ඒ සඳහා විශාල මුදලක් වැය කරන්නට ඔහුට සිදු වී තිබෙන බව අපට පෙනී යනවා. තම කුඹුරු සකස් කර ගැනීම සඳහා ගත යුතු නොයෙක් පියවරවල් වෙනුවෙන් විශාල වියදමක් දරන්නට ගොවියාට සිදු වී තිබෙනවා. ට්‍රැක්ටර් පාවිච්චිය පිළිබඳව මා මුලින් කරුණු සඳහන් කළා. කුඹුරු ගොවිතැන සඳහා ට්‍රැක්ටර් පාවිච්චි කිරීම ඉතාම අසාර්ථක පිළිවෙලක් බව ඔප්පු වී අවසානයි. එය මා බොහෝ කලක සිටම පෞද්ගලිකව දන්නා දෙයක්. මෙය අසාර්ථක වීමට එක් හේතුවක් නම්, ට්‍රැක්ටර් පාවිච්චිය සඳහා යෙදවීමට ගම්බද ගොවියාට මුදල් නොමැතිවීමයි. තම කුඹුරු සීසාන කාලයේදී ඒ සඳහා ට්‍රැක්ටර් ලබා ගැනීමට විශාල මුදලක් ණයට ගන්නට ගොවියාට සිදු වී තිබෙනවා. සමහර විට, සමුපකාර සමිති ණයෙන් ලබා ගන්නා මුදල ඒ සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

සෑහෙන්නේ නැහැ. එම නිසා, මීට කලින් වාර්තාවකින්ද පෙන්වා දුන්නාක් මෙන්—පෞද්ගලික ගිනි පොලීකාරයන්ගෙන් ණය ලබා ගන්නට ගොවියාට සිදු වී තිබෙනවා. සමුපකාර සමිතියෙන් ලබා ගන්නා මුදලත් පොලීකාරයාගෙන් ලබා ගන්නා මුදලත් යන්ත්‍රෝපකරණ සඳහා යොදනවා. ශ්‍රමය වැය කරන්නට ගොවියාට අවසථාවක් ලැබෙන්නේ නැහැ. අනෙක් කරුණ, ට්‍රැක්ටර් ආදී අවශ්‍ය යන්ත්‍රෝපකරණ නියම වේලාවට ලබා ගන්නට නොහැකි වීමයි. ට්‍රැක්ටර් සොයා ගැනීමට අහිංසක ගොවියා දවස් හතරක් පහක් තිස්සේ කඩමණ්ඩියේත් ට්‍රැක්ටර් මධ්‍යස්ථාන වලත් ට්‍රැක්ටර් හිමියන් පස්සේත් ඇවිදිනවා. එහෙත්, අවශ්‍ය වේලාවට ඒවා ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ. එසේ රස්තියාදුවන කාලය තුළ විශාල මුදලක් ගොවියාගෙන් වියදම් වෙනවා. ඒවාගේම, ඔහුගේ ශ්‍රමය වැය වන්නේ ගොවිතැන් කටයුතුවලට නොව යන්ත්‍රෝපකරණ සෙවීම සඳහා රස්තියාදු වීමටයි. එසේ සපයා ගත් යන්ත්‍රය කුඹුරේ යොදවා ඉන් පසුව ගන්න පියවරවල් ගැන ඇමතිතුමා මට වඩා හොඳට දන්නවා. කෘත්‍රිම පෝර වගී, කෘමිනාශක බෙහෙත් වගී, ආදී සියල්ලක්ම යොදන්නට යන අවස්ථාවන්හිදී ඒ සඳහා වැය වන මුදල් දරා ගන්නට කොහොමවත් බැරි තත්ත්වයකටයි අද ගොවියන් පත් වී සිටින්නෙ. ඊට පසුව කපා පාගා ගන්න කාලය එන විට විශාල වශයෙන් මුදල් සොයා ගැනීමට ඔහුට සිද්ධ වෙනවා. රු. 25 ක් දෙනවාය කියා මෙහි තිබෙනවා. එහෙත් අද ගම්බද තත්ත්වය දෙස බලන විට මේ ආධාර ප්‍රමාණවත් නැහැ. කපා පාගා ගැනීමේ කාර්යයේදී ඊට වඩා වැඩි මුදලක් වියදම් වෙනවා. අන්තිමේදී ගොවියාට සිදු වන්නෙ මොකක්ද? ඒ ණයවලින් බේරීම සඳහා එක්කෝ සලාක පොත් උගස් කරන්න ඕනෑ; එසේ නැතුව සලාක පොත් බේරාගන්න නම් තමන්ගේ සුළු ඉඩම් ප්‍රමාණය උගස් තබන්න ඕනෑ. ඒ නිසා මේ කාරණය—ගම්බද ගොවියාගේ ඕනෑ එපාකම් අනුව සකස් වී නැති කාරණය—කෙරෙහි ගරු ඇමතිතුමාගේ විශේෂ කල්පනාව යොමු විය යුතුයි. ඒ වාගේම ඊට ප්‍රතිකර්මයක් සෙවිය යුතුයි. ඒකට ප්‍රතිකර්ම සොයන්නෙ නැතිව ගොවියාට තිබෙන සලාක පොත් ටික නැති කර දැමීම ඉතාමත් අසාධාරණයක් බව මා පෙන්වා දෙන්නට කැමතියි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගෙවන්න පුළුවන්කම තිබියදීත් ගෙවන්නෙ නැත්නම්?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennekoon)

ඒ තරම් අසාධාරණව අපේ ගොවියා ගැන ඇමතිතුමා සිතීම වැරදියි. මේක ආණ්ඩුවේ දෙයක්ය මේක කොහොම හරි කාබාසිනියා කරන්නට ඕනෑය, යන චේතනාවෙන් සිටිය අය ඇත්නම් ඒ ඇත්තන් ගැන යම් ප්‍රතිකර්ම යෙදීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. මා කියන්නේ ගම්බද තිබෙන තත්ත්වය ගැනයි. ඒ නිසයි මා ඇමතිතුමාට කිව්වේ මෙසේ ණය නොගෙවන හේතු ගැන කල්පනා කර බලන්නය කියා. කොළ ටික පාගා අවසන් වනවාත් සමගම අර ගිනි පොලීකාරයන් කමතට ඇවිත් ඉන්නවා. ඔවුන් ඒ වී ටික අරන් ගියාම ගොවියන්ට ණය ගෙවන්නට තත්ත්වයක් නැහැ. එම නිසා තම සලාක පොත් ටික දෙන්නට ගොවියාට සිද්ධ වෙනවා. එසේ නැත්නම් ඒ සලාක පොත් ටික බේරා ගැනීම පිණිස තමන් සතුව ඇති සුළු ඉඩම් ප්‍රමාණය උගස් තබන්නට ඕනෑ. එම නිසා ගම්බද ගොවියාගේ ආර්ථික තත්ත්වය සකස් කිරීම ඉතාමත් අවශ්‍ය දෙයක්.

කරුණු මෙසේ සිදු වන බැවින් ගම්බද ගොවියාට ඉතුරු කිරීමට අවස්ථාවක් නැති බව මා මුලිනුත් සඳහන් කළා. ඉතුරු කරන්න දෙයක් නැහැ. ආදායම් පැත්ත අඩුයි; වියදම් පැත්ත වැඩියි. ආදායම් මාර්ග දවසින් දවස අඩු වේගන යනවා. මා සෑම තිස්සේම පෙන්වා දෙන කාරණයක් තමයි, විශේෂයෙන් මී හරක් ගොවියන්ගේ දකුණු අත වාගේ බව. නියම විධියට හරක බාන ඉන්නවා නම් ට්‍රැක්ටර් කාරයන් පසු පස යාමට ගොවියන්ට ඇති අවශ්‍යතාව මොකක්ද? කලට වේලාවට හරකා බාන බැඳගෙන ගොවිතැන් කර ලබාගත් ආදායම ඔහුගේ ආරක්ෂාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේතු වුණා. අද ගම්බද එවැනි තත්ත්වයකට තුඩු දෙන විධියේ කරුණු සම්පාදනය වී තිබෙනවාද? උතුරුමැද පළාත, වයඹ පළාත, වැනි පළාත්වල දිසාපතිවරුන් අද මෙම තත්ත්වය පැහැදිළි කර ගෙන තිබෙනවා. ඒ පළාත්වල ගොවීන්ට සීසෑමට අවශ්‍ය එළ හරකුන් සහ මී හරකුන් හරියාකාර සපයා නොදෙනවා නම් මෙම වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට බැරිය යන කාරණය අද එම පළාත්වල නතු දන්නා අය අවබෝධ කරගෙන සිටිනවා. මී හරක් මැරීම—හරකුන් ලොරිවලට පටවාගෙන ඒම—තහනම් කරන්නැයි ඉල්ලීම් පවා කර තිබෙනවා. පසුගිය දවස්වල මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) පවා කිව්වා මේ ගැන. බස් නැති වෙලාවේ දී බස් ගෙනෙන්නට බැරි වී තිබෙන්නේ බස් ගෙන්වීමට තිබෙන මුදල් ඔක්කොම ලොරි ගෙන්වීමට දී තිබෙන නිසා බව කියා තිබෙනවා. මේ ලොරිවලට උතුරුමැද පළාතෙන් එහෙම හොර හරක් පටවනවා. ගම්බද ගොවියාට සැලසී තිබෙන සෙත එයයි. මෙමම තත්ත්වය සැලකිල්ලට යොමු කළ යුතුයි.

මේ ඇමතිතුමායි ගම්බද ගොවියාගේ විශේෂයෙන් කුඹුරු ගොවිතැන් කරන්නන්ගේ ආරක්ෂකයා විය යුත්තේ. එහෙත් කුඹුරු වැඩ කරන අහිංසක ගොවියා කුමන විධියකින් හෝ මුදලාලිලාට උකස් කර තැබීමට එතුමා සූදානම් වෙනවා නම් අපේ ගම්බද ගොවියාගේ තත්ත්වය ආරක්ෂා වන්නේ කෙසේ ද? මේ විදිනදුකෙන් අපි ඔවුන් මුදවා ගන්නේ කෙසේ ද? ගොවියා පිළිබඳව ඇමතිතුමාගේ විශාල ඕනෑකමක් තිබෙන්නට පුළුවනි. අද ගම්බද ගොවියාගේ තත්ත්වය කුමක්දැයි අපට වඩා ඇමතිතුමා දන්නවා. එසේ හෙයින් මෙවැනි කරුණුවලට තමන්ගේ හිත යොමු කරන හැටියට මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. අසාධාරණයක් කරන්නට එපා. ගෙවන්නට පුළුවන්කම තිබෙනවා නම් නොගෙවා සිටින්නෙ නැහැනෙ. මා මෙසේ කියන්නෙ තර්කයකින් දිනන්නට නොවෙයි. මා කියන්නේ අද ගම්බදව පවතින නියම තත්ත්වයයි. එය අපි අවංකව පිළිගන්නට ඕනෑ. විශෙෂයෙන් කුඹුරු ගොවිතැන් කිරීම සඳහා ණය ලබාගන්න ගොවියාට එම ණය ඉල්ලීමට තරම් තත්ත්වයක් ඇති නොකළොත් රෝගයේ නිධානය සොයා ඊට ප්‍රතිකාර කළාය කියා සිතන්නට පුළුවනි. කුඹුරු වැඩ කරන ප්‍රදේශවලට වාරිමාර්ග පහසුකම් නැහැ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ඇමතිතුමා විශාල ප්‍රයත්නයක් දරණ බව පෙනෙනවා. එහෙත් ඊට වඩා ලොකු උනන්දුවක් ගොවිතැන කෙරෙහි දක්වන්නට වුවමනා බව කිව යුතුව තිබෙනවා. උතුරුමැද පළාතේ ණය පිළිබඳව අපට පැහැදිළිව කරුණු පෙනී යනවා. 1965-66 දී ණය ගෙවීමේ තත්ත්වය කුමක් ද? කුරුණෑගල ආපසු ගෙවන්නට තිබෙන ප්‍රමාණය රු. 13,44,588 යි. රට පුරා ආපසු ගෙවන්නට බැරිව තිබෙන මුදල් ප්‍රමාණය කොතෙක් විය හැකිදැයි ඒ අනුව පෙනෙනවා. විශේෂයෙන් කුරුණෑගල, අනුරාධපුරය, පුත්තලම සහ හම්බන්තොට වැනි දිස්ත්‍රික්කවල උදවිය ණය ආපසු ගෙවීමේ අපහසුකමට මුහුණ දෙනවා. හේතුව කුමක් ද? ගොවිතැන් කරන්නේ අහස් දිය බලාපොරොත්තුවෙන්. නමුත් නියම වෙලාවට වැස්ස නොලැබී යාම නිසා, ණය මුදල් ලබාගෙන යන්ත්‍ර සූත්‍ර, උපකරණ යොදා වගා කළත්, එයින් විශාල අස්වැන්නක් ලැබේය කියා බලාපොරොත්තු වුණත් ඒ සියල්ල විනාශ වී යනවා. එම තත්ත්වය නැති කරලීම සඳහා අවශ්‍ය පියවර තවමත් ගෙන නැහැ. වාරිමාර්ග පහසුකම් නොමැති, සාර්ථක විධියේ වාරිමාර්ග ක්‍රම නැති ප්‍රදේශවල ගොවිජනතාව ලබා ගන්නා වූ ණය මුදල් ආපසු ගෙවීමට, මා කලින් සඳහන් කළ ස්වාභාවික හේතූන් නිසා නොහැකි වී ගියොත්, එබඳු අවස්ථාවලදී අසරණ ගොවියන් මේ අන්දමේ තද නීතිරීතිවලින් බැඳ තැබීම අසාධාරණ නොවේද කියා ප්‍රශ්න කරන්න කැමතියි. තමන්ගේ වගාව ජලය නොමැති කම නිසා විනාශවී ගියොත්, ලැබිය යුතු අස්වැන්න නොලැබී ගියොත්, කොහොමද ණය මුදල් ආපසු ගෙවන්නෙ? බලාපොරොත්තු සහිතව වගා කළත් විනාශ වී යන අවස්ථා අප්‍රමාණ ඇති වෙනවා.

සහල් සලාක පොත් ආපසු ගැනීමේ මෙමම ක්‍රමය යටතේත් එබඳු ස්වාභාවික ආපදාවලදී සහනයක් සලකා තිබෙනවාය කියා ඇමතිතුමා කියනවා. යම් විධියකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම් තෙන්නකෝන් මයා.]

සම්පූර්ණයෙන් විනාශව නොගියත්, බලාපොරොත්තු වූ ආකාරයෙන් අස්වැන්න නොලැබී ගියහොත්, එසේ ලැබෙන අස්වැන්න ප්‍රමාණයෙන් ණය මුදල් ආපසු ගෙවීමට තරම් ප්‍රමාණවත් නොවුවොත්, ඒ අයට තමන්ගේ හා තම පවුලේ උදවියගේ සලාක පොත් භාර දෙන්න සිදු වෙනවා නොවෙද? එසේ දෙන්න සිදු වුණොත් ඒ උදවිය කොයි විධියේ තත්ත්වයකට පත් වෙයිද කියන කාරණය ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙබඳු ව්‍යාපාරයක් සාර්ථක කර ගන්නට නම් වාරිමාර්ග පහසුකම් සැලසීම පිණිස දැනට වඩා උනන්දුවක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් දැක්විය යුතුව තිබෙනවා. සමහර විට ගරු ඇමතිතුමාට අයත් නැති අංශ මේ සඳහා සම්බන්ධ කර ගන්න වෙනවා. නිකවැරටිය කොට්ඨාශයේ රිදී බැදි ඇල ව්‍යාපාරයට ක්‍රමවත් වාරි මාර්ග ක්‍රමයක් ඇතත්, එය තවමත් හරිහැටි සම්පූර්ණ කර නොමැති නිසා ගොවියන්ට එයින් නියම ප්‍රයෝජන ලබාගන්න බැරි වී තිබෙනවා. මේ අන්දමට වාරිමාර්ග ක්‍රම ඇති ප්‍රදේශවල පවා ඒවා නිසියාකාර ක්‍රියාවේ යොදවා නැති නිසා, ස්ථිර වාරි මාර්ග තිබෙන ගම්බද ප්‍රදේශවල ගොවිජනතාවට පවා විශාල අපහසුකම්වලට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. සමහර විට ගරු ඇමතිතුමාට මෙම වාරිමාර්ග කට යුතු ගැන සොයා බැලීමට අවස්ථා නොලැබී යනවා ඇති. ඇත්ත වශයෙන්ම ගොවිතැන් සම්බන්ධයෙන් කාරක සභා පත්කර ඇතත් ඇතැම් ඒවායේ වැඩ කටයුතුත් එතරම් සතුටුදායකය කියා කියන්න බැහැ. එම නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අතර යම්කිසි විධියක සම්බන්ධතාවක් ඇති කර ගෙන ගොවියාට වතුර ලබාදීමේ ප්‍රශ්නය නිරාකරණය කර දීමේ වගකීම ගරු ඇමතිතුමා භාර ගන්න ඕනෑ. එමෙන්ම ණය ලබාදී ආපසු එම මුදල් ලබා ගැනීමට උත්සාහ කිරීම මිස වෙනත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම සුදුසු යයි අපට අනුමත කරන්න බැහැ.

අනික් කාරණය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ සකස් කිරීමට අදහස් කරනු ලැබූ ගොවිතැන් රක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළට කුමක් සිදු වුයේ දැයි ප්‍රශ්න කරන්න කැමතියි. යම් විධියකින් ගොවිතැන් වගාව රක්ෂණය කිරීමේ එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබුණා නම්, ගොවිතැන් පාලුවී ගිය අවස්ථාවලදී, ණය මුදල් ආපසු ගෙවීමට නොහැකිව ගිය අවස්ථාවලදී රක්ෂණයේ පිහිටෙන්, තමන්ගේ සහල් සලාක පොත් නැතුව යාමේ භයානක තත්ත්වයෙන් බේරෙන්නට ගොවියන්ට අවකාශ ලැබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

රක්ෂණ සම්බන්ධව වාර්ෂිකව හෝ කන්නක් පාසා හෝ ගාස්තු ගෙවිය යුතු නොවැ? එහෙම නැත්නම් රක්ෂණය කරන්නේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු ඇමතිතුමා ඒ වැඩ පිළිවෙළ සකස් කර පහසු ක්‍රමයට ගොවියාගෙන් ඒ මුදල් අය කර ගන්න.

**ගරු එම්. ඩී බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මුදල් අය කරන්නට තමුන්නාන්සේලා ඉඩ දෙන්නේ නැහැ නොවැ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඇමතිතුමා ගම්බද තත්ත්වය ගැන හොඳින් දන්නා කෙනෙක්. ඉස්සර අපේ ගම්වල හලාරිස් ගත්තේ කොහොමදැයි ගරු ඇමතිතුමා දන්නවා නොවැ? ඒ කාලයේදී එය ප්‍රශ්නයක් වී තිබුණේ නැහැ. ගොවියාගේ කමතේ වී තිබෙන වේලාවේදී වෙල් මුලාදෑනියා ගොස් නියම බද්ද ලබා ගන්නවා. කමතේ හොඳට වී තිබෙන කොට "මෙන්න මේ බද්ද ගෙවන්න" යයි කී විට ගොවියා කිසිම පැකිලීමක් නැතිව ඒක ගෙවනවා. අන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ පිළිවෙළට මුදල් තියෙන අවස්ථාවේදී අය විය යුතු මුදල් අය කර ගන්නට වැඩ පිළිවෙළක් යොදන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මුදල් අය කරනු ලබන්නේ සමුපකාර සමිති මගින්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඔව්, කුඹුරු පනත ගැන පසුව කියන්නම්. ඊට පෙර රක්ෂණය ගැනත් යම් කිසි විධිවිධානයක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර පළාත්වල කුඹුරු පනත හරිහැටි ක්‍රියාත්මක වන්නේ නැහැ. කුඹුරු පනත යටතේ පිහිටුවා තිබෙන ගොවි කාරක සභා වලින් ඉටුවිය යුතු යුතුකම් හරි හැටි ඉෂ්ට නොවන බව පෙනී යනවා. ගොවි කාරක සභාවලින් ඉටු විය යුතු යුතුකම් හරිහැටි ඉෂ්ට නොවන විට කුඹුරු ආසනාසි වෙනවා. වාරිමාර්ග ක්‍රම යටතේ තිබෙන විශාල වෙල් යායවල කටයුතුත් හරියාකාර ලෙස නොකෙරෙන්නේ කුඹුරු පනත යටතේ පිහිටුවා තිබෙන සමහර ගොවි කාරකසභාවල නොසැලකිල්ල නිසයි. ඇළ වේලි හරි හැටි ශුද්ධ කරන්නේ නැහැ. හරියාකාර ලෙස ඒවා කෙරෙනවාදැයි බලන්නට කෙනකු නැහැ. ගොවි මණ්ඩල නම් තිබෙන බව ඇත්තයි. එහෙත් ඒ සමහර ගොවි මණ්ඩලවල කටයුතු හරියාකාර ලෙස නොකෙරෙන බව පිළිගන්නට සිදු වී තිබෙනවා. මේ තත්ත්වය යටතේ විපාක විඳින්නෝ අසරණ ගොවියෝයි. ඒ නිසා ගමේ යථා තත්ත්වය පර්යේෂණයට භාජනය කරන්නට ඕනෑ. ඒ ඒ ප්‍රදේශයන් අනුව තත්ත්වය සැලකිල්ලට භාජනය කර වාරිමාර්ග ආදී පහසුකම් සැලැස්වීම අවශ්‍යයි. ගොවි මණ්ඩලවලින් හරියාකාර ලෙස වාරිමාර්ග සකස් වන්නේ නැහැ. ඒ නිසා වගාව සඳහා ණය ගන්නා ගොවියාගේ ගොවිතැන පාළු වුවහොත් ඔහු ඉතාමත්ම අමාරු තත්ත්වයකට පත් වෙනවා.

වැටවල් බැඳීම හරියට කෙරෙන්නේත් නැහැ. ඒ වැඩ භාර වී ඇත්තේ ගොවි මණ්ඩලයටයි. එහෙත් ඒ මණ්ඩලයෙන් ඒවැඩ හරියාකාර ලෙස නොකෙරෙන නිසා පාඩුව විඳින්නට සිදු වන්නේ අසරණ ගොවියාටයි. ඒ නිසා කුඹුරු පනත යටතේ මේ විධියට කරුණු සිදු වී ඇති හෙයින් ඒවා ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු විය යුතුව තිබෙනවා.

බෙහෙත් යයි කියමින් වස දුන් නිසා සමහරුන් දැන් මැරී ඉවරයි. ඉතිරිව සිටින අයටත් ඒ බෙහෙත් ගන්නට බල නොකරන මෙන් මා ඉල්ලා සිටිනවා. ගොවියාගේ ප්‍රශ්න සම්බන්ධයෙන් නියම අන්දමින් පිළිතුරු සැපයීමට උත්සාහ කරන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.27

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමාගේ සහ ඇමතිතුමා යටතේ වැඩ කරන නිලධාරීන්ගේ නීති විරෝධි ක්‍රියා නීති ගත කිරීම සඳහා ගෙන එනු ලබන මේ පනත ගැන වචන ස්වල්පයක් කතා කරන්න මා අදහස් කරනවා. පළමුවෙන්ම මා එක් කාරණයක් පැහැදිලි කරන්න කැමතියි. ණයක් ගත් කෙනෙක් එම ණය ආපසු නොගෙවීම අනුමත කිරීමට විරුද්ධ පාර්ශ්වයේ කිසිම කෙනෙක් ඉදිරිපත් වෙනවා ඇතැයි මා කල්පනා කරන්නේ නැහැ. ගත් ණය ආපසු ගෙවීමට යුතුකමක් තිබෙන බවත් ඒ ණය ආපසු ගෙවන්නේ නැත්නම් ඒ ණය එකතු කිරීමට සෑම සාධාරණ බල පෑමක්ම සෑම යුක්තිසහගත පියවරක්ම ගත යුතු බවත් විරුද්ධ පක්ෂය පිළිගන්නවා. නමුත් මෙහි ඇති වී තිබෙන ප්‍රශ්නය නම් ණයක් නොගෙවීම කරණකොට ගෙන සලාක පොත් අල්ලා ගැනීම යුතුද නැද්ද කියන ප්‍රශ්නයයි. පළමුකොටම ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙන්නේ මේ දක්වා කර තිබෙන බල පෑමෙන්—සමහර විට මෙය නීති විරෝධි වෙන්න පළුවනි—කොයිතරම් දුරට සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවාද යන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ගැනයි. අපි ඒ කාරණාව දැන ගන්න කැමතියි. මුලින්ම කතා කළ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) 1968 මහ බැංකු වාර්තා වෙන් කරුණු ඉදිරිපත් කරමින් මෙම සලාක අල්ලා ගැනීමෙන් සියයට 7 ක පමණ ණය මුදලක් එකතු කර ගෙන තිබෙන බවත් කිව්වා. නමුත් ලබාගත යුතුව තිබෙන ණය මුදල ඉතාමත් විශාල ගණනක් ලැබී තිබෙන්නේ ඉතාමත් සුළු ප්‍රමාණයකුයි. ඒ නිසා මා පළමුවෙන්ම ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි—කවුරුන් හෝ වේවා ණය මුදල් එකතු කිරීමට විසඳුමක් වශයෙන් සලාක පොත් අල්ලා ගන්නය කියා අවවාද කරන්න ඇති—සලාක පොත් ඇල්ලීමේ ප්‍රතිකර්මය සාර්ථක වී තිබෙනවාද යන කරුණ ගැන. ඒ කරුණ ගැන කල්පනා කර බලන්නය කියා මා ඉල්ලා සිටිනවා. මට පෙනෙන හැටියට නම් එය සාර්ථක වී නැහැ. කෙසේ වෙතත් ඒ ගැන තමුන් නාන්සේගේ අවධානය යොමු කරන්න.

දෙවැනි කරුණ හැටියට මා ඉදිරිපත් කරන්නේ ඊට වඩා ප්‍රතිපත්ති සහගත ප්‍රශ්නයකුයි. ණයක් නොගෙවීම කරණ කොට ගෙන හාල් සලාක පොත් රජය විසින් අල්ලා ගැනීම සාධාරණ ක්‍රියාවක්ද? ඇමතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට පමණක් නොව ආහාර ඇමතිවරයා හැටිය ටත් කටයුතු කරනවා. කෘෂිකර්ම ඇමති වරයා හැටියට කල්පනා කරන විට ණය පියවා ගැනීම සඳහා මේ විධියට හාල් සලාක පොත් අල්ලා ගැනීමට අදහස් කළා. නමුත් ආහාර ඇමතිවරයා වශයෙන් එවැනි පියවරක් ගැනීම සුදුසුද කියා ටිකක් කල්පනා කර බලන්න. මක් නිසාද? ලංකාවේ ඇති කර තිබෙන හාල් සලාක පොත් ක්‍රමය මා සිතන අන්දමට සමාජ සේවයට අයිති ක්‍රමයක්. මට මතකයි දැනට අවුරුදු 40 කට පමණ ප්‍රථම එංගලන්තයේ එවකට සිටි ප්‍රගති ශීලී ඉතාමත් කීර්තිමත් ලේඛකයෙක් වන බර්නාඩ් ෂෝ මහතා ඉදිරිපත් කළ යෝජනාවක් ගැන. ඒ රටේ ඒ කාලයේ පැවති තත්ත්වයේ හැටියට දිළිඳුකම තර මක් දුරටවත් විසඳා ගැනීමට එතුමා ඉදිරි පත් කළ යෝජනාව නම් හැම දෙනාටම නොමිලේ පාන් සැපයිය යුතු බවයි. එසේ කළොත්—ඒ සඳහා රජයෙන් යම්කිසි වියදමක් දැරිය යුතු වෙනවා—කිසිවෙකුට හාමතේ සිටීමට සිදු වන්නේ නැහැ. සමාජවාදී යෝජනාවක් හැටියටයි බර්නාඩ් ෂෝ මහතා එදා ඒ යෝජනාව ඉදිරිපත් කළේ. හාල් සේරුව ශත විසිපහ බැගින් සතියකට හාල් සේරු දෙකක් සලාක ක්‍රමය යටතේ බෙදා දීමට ඊට අවුරුදු ගණනකට පසුව ලංකාණ්ඩුව ගත් තීර ණය මා හිතන හැටියට එදා බර්නාඩ් ෂෝ මහත්මයා, සියලු දෙනාටම නොමිලයේ පාන් බෙදා දීම උචිතයයි කළ යෝජනා වට සමාන දෙයක් ක්‍රියාත්මක කිරීමක් බව කියන්නට පුළුවනි. ආණ්ඩුව එක් තරා ප්‍රමාණයක් පාඩු විඳගෙන හාල් සේරුවක් ශත 25ක් වැනි සුළු මුදලකට සලාක ක්‍රමය යටතේ බෙදා දීම හේතු කොටගෙන ලංකාවේ අපට එක් වැදගත් සෙතක් ඇති වුණු බව පිළිගත යුතුව තිබෙනවා. මේ රට අවට අග්නිදිග ආසි යාවේ රටවල් ගණනාවකම දිළිඳුකම නිසා කෑම සපයා ගන්නට නොහැකි වීමෙන් යම් යම් පුද්ගලයින් මිය ගිය නමුදු ලංකාවේ අපට ඒ විධියේ කනගාටුදායක තත්ත්වයක් ඇති නොවූ බව ආඩම්බර යෙන් කියන්නට ඕනෑ. ලංකාවේ කිසිම කෙනෙක් හාමතේ මිය ගොස් නැතැයි අපට ආඩම්බරයෙන් කියන්නට පුළුවනි. සමහර විට සැලකිය යුතු පිරිසක් මන්ද පෝෂණය නිසා මිය යන්නට ඇති. එහෙත් කන්නට නැති නිසා මිය ගිය පුද් ගලයකු ගැන අපට අහන්නට ලැබී නැහැ. එය සතුටුදායක තත්ත්වයක් හැටියට පිළිගන්නට පුළුවනි.

මීට පෙර පැවති ශ්‍රී ලංකා නිදහස් පක් ෂයේ ආණ්ඩුවත්, 1956ට පෙර පැවති එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවත් බොහොම ආඩම්බරයෙන් කළ ප්‍රකාශයක් මට හොඳට මතකයි. "මේ රටේ වාමාංශික යන් කොයි තරම් කෑ ගැහැව්වත් එක කාරණයක් ගැන කවුරුත් ආඩම්බර විය යුතුයි; කිසිම කෙනකුට කන්න නැතිව මැරෙන්න ඉඩ දුන්නේ නැහැ." ඔන්න ඔය විධියටයි කිව්වේ. ඒක ඇත්ත "බුරු මය ගැන බලන්න; තායිලන්තය ගැන බලන්න; මේවා හාල් නිෂ්පාදනය කරන රටවල්; ඉන්දු-චීනය ගැන බලන්න—ඇන් ඉන්දු-චීනය හඳුන්වනු ලබන්නේ වියට් නාමය නමිනුයි—ලංකාවේ නම් එහෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයක් වෙලා නැහැ." ඔය ආදි වශයෙන් ප්‍රකාශ කළා. එයින් එක් වැද ගත් කාරණයක් පැහැදිලි වෙනවා. මේ රට පාලනය කළ ආණ්ඩු මහජනයා කෙරෙහි තිබුණු ප්‍රථම වගකීමක් ගැන හැකි තරම් දුරට ක්‍රියා කර තිබෙනවායයි ආඩම්බරයෙන් කියා තිබෙනවා. එහි වටිනා කම පිළිගන්නට සිද්ධ වෙනවා. බොහෝ දුරට එයින් හොඳක් සිද්ධ වුණා. හාල් සලාකය අනුව හාල් සේරුවක් ශත 25 බැගින් හාල් සේරු දෙකක් ගන්නට ඉඩ තැබීම නිසා හොඳක් සිදු වුණා. එහෙත් වර්තමාන ආණ්ඩුව ඒ තත්ත්වය තරමක් දුරට වෙනස්කර තිබෙනවා. හාල් සේරු දෙකක් සලාකයට ඇතුළත් කර එකක් සත විසිපහ බැගින් දෙනවා වෙනුවට හාල් සලාකය එක් සේරුවකින් කපා දමා තිබෙ නවා. හාල් සේරු දෙකින් එක සේරුවක් අයින් කර තිබෙනවා. එසේ කළේ වී නමුත් අනෙක් ඉතිරි සේරුව නොමිලයේ දෙනවා. එක් අතකින් බලන විට ඒ පියවර මීට පෙර මා සඳහන් කළ පරිදි, බර්නාඩ් ෂෝ විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට ටිකක් කිට්ටුයි.

බර්නාඩ් ෂෝ කිව්වේ පාන් නොමිලයේ දෙන්න කියායි. වර්තමාන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව නොමිලයේ හාල් දීලා තියෙනවා. හැබැයි එක සේරුවයි, දීලා තියෙන්නේ. එක සේරුව මදි. පාන් දෙන් නැයි කීමෙන් බර්නාඩ් ෂෝ අදහස් කෙළේ පාන් රාත්තලකට වැඩි ප්‍රමාණයක්—කන් නට පුළුවන් තරම් ප්‍රමාණයක්—දිය යුතුය යන්නයි. කෙසේ වෙතත් හාල් එක සේරු වක් නමුත් දීලා තිබෙනවා නොවැ. එසේ කිරීමෙන් එක්තරා ප්‍රමාණයකට නමුත් ඒ ප්‍රතිපත්තියේ පිහිටා තිබෙනවා.

එසේ කිරීම ගැනත් ලෝක බැංකුව විවේ චනය කර තිබෙනවා. දුප්පතාට පහරක් ගහලා තියෙනවා. ඒ කොයි හැටි වෙතත්, එක් හාල් සේරුවක්වත් දීමෙන් ඉතාමත් දුප්පත් උදවියට සහනයක් දී තිබෙන බව පිළිගත යුතුයි. ඒ නිසා ඒ ගැන ස්තුති වන්ත විය යුතුයි. එයිනුත් එකක් වෙලා තියෙනවා. කිසිම කෙනෙක් තවම මේ රටේ කන්නට නැතිව මිය ගොස් තිබෙනවායයි අපට සාක්ෂි ඇතිව දැනගන්නට නැහැ. සමහර විට එසේ මිය යන්නටත් ඇති. එහෙත් එවැන්නක් ගැන අපි දන්නේ නැහැ. මන්දපෝෂණය නිසා රෝග ඇති වෙලා නම් මැරිලා තියෙනවා. එහෙත් මගේ සැකයක් තිබෙනවා ගරු ඇමතිතුමා ඉදිරි පත් කර තිබෙන යෝජනාවක් නිසා මෙවැ නි තත්ත්වයක් මතු දවසක ලංකාවේ ඇති වන්නට පුළුවන් බවට. එවැන්නකට ඉඩ තිබෙනවා. එක හාල් සේරුවක් නොමිලයේ දෙන්නේ තමුන්නාන්සේලා මොන අදහ සක් උඩදැයි මා දන්නේ නැහැ. මා හිතන් නේ මෙය කරන්නේ එක් අදහසක් උඩ පමණක්ය කියායි. ඒ අදහස නම් සමාජ සේවයක් හැටියටය කියායි. අප නොමිලේ අධ්‍යාපනය දෙනවා. නොමිලේ බෙහෙත් හේත් දෙනවා. ඒ වාගේම නොමිලේ හාල් සේරුවත් දෙනවාය කියනවා නම්, මා තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්නයක් අස නවා. මේ ගොවි ණයක් අරගෙන ආපසු නොගෙව්වොත් ඒ ගොවියාගේ දරුවාට අසනීපයක් වුණාම ආණ්ඩුවේ රෝහලින් නොමිළයේ බෙහෙත් දෙන්නට එපාය කියා නියෝගයක් කරන්නට ලැස්තිද? එහෙම නැත්නම් ඒ ගොවියා ගත් ණය ආපසු නොගෙව්වාය කියන වරදට ඒ ගොවියාගේ දරුවාට අද දීගෙන යන නිද හස් අධ්‍යාපනය නොදිය යුතුය කියනවාද? මට පෙනෙන හැටියට අද නොමිලේ ලැබෙන හාල් සේරුව නැවැත්වීමත් එවැනි ක්‍රියාවක්. මට ඒ ක්‍රියා දෙක අතර වෙනසක් පෙනෙන්නේ නැහැ. ඕනෑම යුක්තිසහගත බලපෑමක් කර එකතු නොවූ ණය එකතු කර ගන්නවාට මගේ විරුද් ධත්වයක් නැහැ. නමුත් රජය විසින් දී ගෙන යන සමාජ සේවා පහසුකම් නැති කරනවාට, ඒ ගොවියාට පමණක් නො වෙයි ඔහුගේ බිරිඳටත් දරුවන්ටත් පහර වදින ආකාරයට නොමිලේ දෙන අධ්‍යා පනය නතර කිරීමටත්, අසනීපයක් වුණාම නොමිලේ දෙන බෙහෙත් නතර කිරීමටත්, බඩගින්නේ මිය යාම වැළැක් වීම සඳහා අද නොමිලේ දෙන හාල් සේරුව නැවැත්වීමටත්, අප විරුද්ධයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන් නේ නැහැ. අවසාන වශයෙන් ගරු ඇමති තුමාට මා යෝජනාවක් කරනවා. එතුමා මේකට සතුටු වේවිද කියා මා දන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත අස් කර ගන්න. අතීතයේදී කළ දේවලට පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

නීති විරෝධී ක්‍රියාවන් කර තිබෙනවා නම් ඒවා නීතිගත කර දීමට පමණක් අප සහයෝගය දෙන්නට සූදානම්. නමුත් අනාගතය සඳහා මේක නොකර ඒ වෙනුවට වෙනත් යෝජනාවක් ක්‍රියාත්මක කරන මෙන් මා ඉල්ලීමක් කරනවා. ඒ කියන්නේ, අර කැපූ හාල් සේරුව නැවත දෙන්න. ඒ ගැන සලකා බලන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ ආණ්ඩුවට දැන් ඒක කරන්නට බැරි තත්ත්වයක් තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ. මේ ලේඛනවල ඇත්ත නැත්ත මා දන්නේ නැහැ. නමුත් පත්‍රවලිනුත්, ගුවන් විදුලියෙනුත්, බැංකු වාර්තාවලිනුත්, අගමැතිතුමාගේ මුඛයෙනුත් කිය වෙන්නේ දැන් වී නිෂ්පාදනය හුඟක් වැඩි වී තිබෙනවාය යන්නයි. කැපූ හාල් සලාකය දුන්නොත් කවුරුත් ඒක විශ්වාස කරනවා ඇති. සමහර විට ඒ අවස්ථාවේදී, ඔය ඇමරිකන් ණය මුදල් ලබා ගන්නට හාල් සලාකය කැපීම කොන්දේසියක්ව තිබුණා නම් හාල් සලාකය කැපීම අවශ්‍ය වූවා වෙන්නට ඇති. නමුත් දැන් ඒ කාලය පසු වී තිබෙනවා නොවැ. විශේෂයෙන්ම මහා මැතිවරණයත් ළං වී තිබෙනවා නොවැ. හැබැයි, මැතිවරණයට ඔන්න මෙන්න කියා තිබියදී හාල් සලාකය දුන්නාට කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ. එහෙම කළොත් මැතිවරණයෙන් පසුව නැවතත් හාල් සලාකය කපන බව ජනතාව දන්නවා. නමුත් දැන්, මැතිවරණයට අවුරුද්දකට පමණ කිට්ටු කාලයක් තිබෙනවා. දැන්මම ඒක කළොත් මිනිසුන් විශ්වාස කරන්නට පුළුවනි. විශ්වාස කළොත් ඡන්දයත් ලැබෙන්නට පුළුවනි. ඊට පසු නැවතත් කපන්නට පුළුවනි. මා මොහොතකට කලින් කීවාක් මෙන් අතීතය සඳහා නම් අපට ව්‍යවස්ථා සම්මත කර දෙන්නට පුළුවනි. අනාගතය සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් නොකර ඒ වෙනුවට අර කැපූ හාල් සේරුව යළිත් දෙනවා නම් කෘෂිකර්ම සහ ආහාර ඇමතිතුමා හැටියට එතුමා මේ රටට හරියාකාර යුතුකම ඉෂ්ට කළාය කියා කල්පනා කර ලබන මැතිවරණයෙන් පසු නැවතත් ඔය ධුරයම ලැබී එතුමා කරගෙන යන සේවය තව දුරටත් කරගෙන යෑමට පුළුවන් වේවිය කියා මා අදහස් කරනවා.

අ. භා. 3.41

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபராதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම සහ ආහාර ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ සමුපකාර සමිති ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත විරුද්ධ පක්ෂය මගින් වගා ව්‍යාපාරය ගැන මෙතෙක් කල් කරන ලද එක්තරා විවේචනයක් අකමැත්තෙන් වුවත් පිළිගැනීමක් හැටියට හඳුන්වන්නට පුළුවනි. මේ ප්‍රශ්නය ගැන විරුද්ධ පක්ෂය අවුරුදු එකහමාරක පමණ කාලයක් තිස්සේ මේ මන්ත්‍රී මණ්ඩලයේදීත් මන්ත්‍රී මණ්ඩලයෙන් බැහැර වෙනත් ස්ථානවලදීත් රජයට පැමිණිලි කර සිටියා වගා ව්‍යාපාරයේ නාමයෙන් ගොවීන්ට මේ විධියට ඇප වශයෙන් හාල් පොත් තබා ගෙන ණය දී ණය ගෙවීමට නුපුළුවන් වූ විට ඒ හාල් පොත් අරගැනීම නීති විරෝධිය කියා. මේ හාල් පොත් ණයට ඇප කර ගැනීම පටන් ගත්තේ ආහාර පාලන පනත යටතේ පනවන ලද එක්තරා රෙගුලාසි වගයක් උඩයි. සමහර ප්‍රදේශවල මේ රෙගුලාසි පනවන්නට කලින් හාල් පොත් ඇපයට ගන්නේ නැතිව ණය දුන්නා. රෙගුලාසි පැනවීමෙන් පසුව හාල්පොත් ඇපයට අරගෙන ණය දීමට පටන් ගත්තා. රජයෙන් අඩු පොළියට ණයක් දෙනවාය කී විට සාමාන්‍ය ගොවීන් පමණක් නොවෙයි ලොකු වෙළඳ ව්‍යාපාරිකයින් පවා ණය මුදල් ලබා ගන්නට ඉදිරිපත් වීම සාමාන්‍ය සිරිතක්. සියයට පහේ නැත්නම් හයේ පොළියට ණය දෙනවාය කී විට ගම්බද දුප්පත් ගොවීන් තමන්ගේ ගොවිතැන් දියුණු කර ගැනීමට මෙන්ම තම තමන්ගේ වෙනත් පෞද්ගලික කටයුතු සඳහාත් යොදා ගැනීමේ පරමාර්ථයෙන් එම ණය ලබා ගැනීම සාමාන්‍ය සිරිතක්. එසේ ලබා ගෙන ඇති හැම ණය මුදලක්ම ගොවිතැන සඳහාම යෙදෙව්වාය කියා ගරු ඇමතිතුමා හෝ මේ ආණ්ඩුව හිතනවා නම් එය මිථ්‍යා විශ්වාසයක් පමණයි. අඩු පොළියට ලැබෙන මේ මුදලින් සෑහෙන කොටසක් ගොවිතැනට යෙදවූ එක ඇත්තයි. එහෙත් තවත් කොටසක් පාරිභෝගික භාණ්ඩ ලබා ගැනීම සඳහා ගොවි ජනතාව අතින් වෙළඳපොළට ඇදෙන බවත් ගම්බදට ගොස් බැලුවොත් තේරුම් ගන්නට පුළුවන්. වගා ව්‍යාපාරයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නාමයෙන් රජය ගොවීන්ට බරපතල උපකාරයක් කරනවාය කියා පෙන්වීමට විවිධ සේවා සමුපකාර සමිති මගින් මේ ණය දීමේ ක්‍රමය පටන් ගත්තා. ණය ආපසු ගැනීමට ගොවීන් පොළඹවා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය ඊළඟට පැන නැගුණා. හාල් පොත් උගසට නොගෙන කොටසකට ණය දුන්නා. ඔවුන්ගෙන් එම ණය මුදල් ආපසු ලබා ගන්නට නොහැකි වූ නිසා හාල් පොත් ඇපයට තබා ගන්නය කියා පසුව නියමයක් කළා. මේ නියෝගය නීති විරෝධි බව පසුගිය අය වැය විවාදයේදී මා විසින් ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාට පැමිණිලි කර සිටි විට ලැබුණු පිළිතුර එය නීතිවිරෝධි නොවේය කියන එකයි. ආහාර පාලන පනත යටතේ පැනවූ රෙගුලාසි අනුව හාල් පොත් ඇපයට අරගෙන ණය නොගෙවූවොත් ඒවා රාජසන්තක කර ගැනීමට බලය තිබෙනවා පමණක් නොවෙයි ගොවියා ගෘහමූලිකයා වශයෙන් සිටින යම් පවුලක ඕනෑම කෙනෙකුගේ හාල් පොත් ලබා ගැනීමට රජයට අයිතියකුත් තිබෙනවා යයි කියන්නට යෙදුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහි ප්‍රතිපත්තිය පිළිබඳව බරපතල ප්‍රශ්නයක් තිබෙනවා. වගා ව්‍යාපාරය ගැන කථා කරන බොහෝ අවස්ථාවල කියන්නේ පැරකුම් යුගයට යනවාය කියලයි. එහෙත් මෙහි දී වගාවට ගන්නවාය කියා ණය ගෙන ඒ ණය ගෙවා ගන්නට නොහැකි වූ විට ණය ගත් ගොවියාගේ පමණක් නොවෙයි ගොවියාගේ දරුවාගේ හාල්පොතත් බලහත්කාරයෙන් රජයට ලබා ගැනීම මා හිතන විධියට පැරකුම් යුගයට යෑමක් නොවෙයි රාජසිංහ යුගයට යෑමක්. තාත්තා කළ වරදට දරුවන්ගෙන් පළිගැනීම පැරකුම් යුගයේ සිදු වූ දෙයක් නොවෙයි. රාජසිංහ යුගයේ ඇහැලේපොල කියා සිටි අදිකාරම් කෙනෙක් කළ වරදට දරුවනුත් භාර්යාවත් මරා වැවට දැම්මාය කියා අපේ ඉතිහාසයේ සඳහන් වෙනවා. තාත්තා කළ වරදට පළිගත්තේ දරුවන්ගෙන්. ඒ වගේ තාත්තා ගත් ණය ආපසු ගෙවා ගන්නට බැරි වූ විට උදුරා ගන්නෙත් තාත්තාගේ හාල් පොත පමණක් නොවෙයි අඩු වයස්කාර දරුවන්ගේ හාල් පොතුත් උදුරා ගන්නවා. මෙය බරපතල මානුෂික ප්‍රශ්නයක්. අපි නීති ප්‍රශ්නය මොහොතකට අමතක කරමු. මෙය, නීති විරෝධි දෙයක් නීත්‍යානුකූල කරන්නට ඉදිරිපත් කළ පනතක්. එම නිසා නීතිය ගැන කථා කරන්නට වුවමනා නැහැ. ඇමතිතුමනි, නීතිය පැත්තකට දමා යුක්තිගරුක මිනිසකු හැටියට මේ ගැන ඩිංගක් කල්පනා කර බලන්න. කැබිනට් මණ්ඩලයේ ඉන්න බලපුළුවන්කාර ඇමතිවරුන් අතුරින් ඔබතුමා සාමාන්‍යයෙන් ශීලාචාර, සාධාරණ ඇමතිවරයකු බවට රටේ පිළිගැනීමක් තිබෙනවා. එවැනි ඇමතිවරයකු වන ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, නැවත වරක් මේ ප්‍රශ්නය සාධාරණව කල්පනාවට ගන්නය කියා.

තාත්තාගෙන් වුණු වැරද්දට පුතාට දඬුවම් දීම සාධාරණද? අප්පොච්චි ණය ගෙවන්න අපොහොසත් වූ පළියට දරුවා හාමතේ තැබීම යුක්තිසහගතද? එසේ දරුවන් හාමතේ තබන්නට කොහෙත්ම කැමැති නැති ගොවියන් කීප දෙනකු තමන්ගේ තහනම් කෙරුණු සහල් සලාක පොත් කෙසේ හෝ නැවතත් ලබාගනු සඳහා මට පැමිණිලි කරන ලදුව, මා ඒ බැව් ඇමතිතුමාට දැනුම් දුන්නා. විරුද්ධ පාර්ශ්වය වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් කියන හැම දෙයක්ම දේශපාලන ඵල ප්‍රයෝජන ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් හෝ රජයට දේශපාලන වාසියක් ලැබීම වැළැක්වීමේ අදහසින් හෝ කියන දේවල් නොව, යථා තත්ත්වය විග්‍රහ කොට ලත් අවබෝධය අනුව කියන දේවල් බව ඔප්පු කිරීම සඳහා, හාල් පොත් ආපසු ගැනීම නැත්නම් සලාක තහනම් කිරීම නිසා හිත් අමාරුවට පත් වුණු ගොවියන් කිහිප දෙනකු ඒ සම්බන්ධයෙන් මට දන්වා තිබෙන කරුණුවලින් කිහිපයක් පමණක් ලුහුඬින් දක්වන්නම්.

හබරාදුවේ, පිටිදුවේ, ඊ. වී. ජී. සරතේලිස් මහතාට සීමාසහිත පිටිදූව විවිධ සේවා සමුපකාර සමිතියෙන් 1968 ජූනි 10 වැනි දින ලිපියක් එවා තිබෙනවා. එයින් කියා තිබෙන්නේ ඔහු ගත් ණය මුදලින් ආපසු නොගෙවා හිඟ තබන ලද රුපියල් 364.12 ක මුදල වහාම ආපසු ගෙවන ලෙස හා නොඑසේ නම් ගෙදර තිබෙන සියලුම හාල් පොත් භාර දෙන ලෙසයි. ඒ ලිපියෙන් දන්වූ පරිදි සීමාසහිත පිටිදූව විවිධ සේවා සමුපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

සමිතිය ඔහුගේ ගෙදර තිබුණු හාල් පොත් සියල්ලම බලහත්කාරයෙන් ගෙන ගොස් තිබෙනවා. ඒ හේතුවෙන් ඔහුගේ දරුවන් බඩගින්නේ පසු වන නිසා, එම හාල් පොත් නැවතත් ඔහුට ලබා දෙන ලෙස ඔහු මගෙන් ඉල්ලා තිබෙනවා.

එපමණක් නොවෙයි, අක්මීමන ඡන්ද දායක කොට්ඨාශයේ, කලහේ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජික එස්. එම්. කුමාරගේ මහතාත් මට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. ඔහුගෙන් සමිතියට අය විය යුතුව තිබුණු රුපියල් 337.70 ක මුදල නොගෙවූවා යයි ඔහුගේ පවුලේ හාල් සලාක තහනම් කර තිබෙනවා. ඔහු පුළුවන් තරම් ඉක්මණින් ඒ ණය ගෙවා තිබෙනවා. එහෙත් ඔහුගේ සලාක තහනම මෙතෙක් ඉවත් කර නැහැ. ඒ බැව් දක්වෙන ඔහුගේ ලිපියේ මෙසේ සඳහන් වෙනවා :

"2. බැංකු ගිණුමට බැර කළ මුදල පිළිබඳව විස්තර සහිත ලිපියක් 1968.8.4 වැනි දින එකී සමිතියේ ගරු ලේකම් මහතාට, ම විසින් භාර දුන් අතර, මුදල් බැර කිරීමේ කුවිතාන් සියද පෙන්වූයෙමි. ගරු ලේකම් මහතා ලියවිලි පරීක්‍ෂා කර බලා මුදල් තැන්පත් වූ බවට සෑහීමට පත්ව, ම විසින් භාර දුන් ලිපිය ලැබුණ බවට එහි දෙවැනි පිටපතේ අත්සන් තබා එය සහ බැංකු කුවිතාන් සියද ආපසු මට භාර දෙන ලදී.

එහෙත්, තහනම් කර තිබුණ මගේ හාල් සලාක වෙනුවෙන් මේ දක්වා එම තහනම ඉවත් කර නැත."

ගත් ණය ගෙවා ගන්නට බැරි වීම නිසා සිදු වූ හදිය සම්බන්ධයෙන් තවත් එවැනිම පැමිණිලි දෙකක් හබරාදුව ආසනයේ, අඟුලුගහ, දොරපේ, "ශ්‍රියානි" නිවසේ, ජී. එච්. ඊ. දයාරත්න සහ හබරාදුව, තල්පේ, "ගොවි හෙවනේ", ජෝර්ජ් සැමුවෙල් යන ගොවි මහතුන් ගෙන් මට ලැබී තිබෙනවා. ඔවුන් ණය මුදල් අරගෙන ඒවා ගෙවීම හිතාමතා පැහැර හැරියා නොවෙයි. ඇත්ත වශයෙන්ම නොයෙකුත් අමාරුකම් නිසා, ලබා ගත් ඒ ණය ආපසු ගෙවීමට බැරි වී තිබෙනවා.

හබරාදුව ඡන්දදායක කොට්ඨාශයෙ වැඩිපුරම ගොවිතැන් කෙරෙන්නේ වාරි මාර්ග පහසුකම් ලබාගෙන නොව අහස් ජලයෙන් බව ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. ගරු ඇමතිතුමා පසුගිය දවසක වප් මඟුලකට ආ බව මට මතකයි. බොහෝම උත්සවාකාරයෙන් පැවැත්වුණු ඒ වප් මඟුලේදී, ක්‍රමානුකූලව, ශාස්ත්‍රානුකූලව වී වැපුරුවා ; පැළ සිටෙව්වා ; පැළ කරන ලද වී ඇට යන්ත්‍රානුසාරයෙන් ඉස්සා. එහෙත්, මාස දෙකක් යන්නට පෙර ඒ සියල්ල සම්පූර්ණයෙන්ම විනාශ වුණු බවට පැමිණිලි ලැබුණු අන්දම ගරු ඇමතිතුමාට මතක ඇති. ඒ ප්‍රදේශයේ බොහෝ තැන්වල ගොවිතැන සාර්ථක වන්නේ හෝ අසාර්ථක වන්නේ හෝ ජල ප්‍රශ්නය උඩයි. එහි වාරිමාර්ග පහසුකම් නැහැ, ජලසම්පාදන ක්‍රම නැහැ. කලට වැස්සොත් හොඳයි. අකලට වැස්සොත් විනාශයි. එවැනි තත්ත්වයක ජීවත් වන ගොවි මහත්වරුන්, තම ගොවිතැන් විනාශ වුණු නිසා ණය මුදල් ගෙවන්නට බැරි බව කියමින් ඒ සඳහා කල් ඉල්ලතොත් ඔවුනට එසේ කල් දීම යුක්තිසහගත නේද ඇමතිතුමනි. එසේ නොකර, එක් කන්නයක් පාළු වුණු වහාම රජය ඒ ගොවීන්ගේ හාල් පොත් ටික ගන්නවා නම්, දෙවියන් වහන්සේ වස්සවන්නේ නැති නිසා අහිංසක ගොවියාගේ දරුවන් බඩගින්නේ සිටින්නට ඕනෑ. මෙහි ඇති යුක්තිය කුමක්ද? ණය ඔප්පු යටතේ ගොවීන්ගේ හාල් පොත් බලහත්කාරයෙන් ගැනීම නීති විරෝධි බව කියා ඊට විරුද්ධත්වය දක්වමින් මා පළාතේ මහජන නියෝජිතයා වශයෙන් පළාතේ දිසාපතිවරයාටත්, ආදායම් පාලක නිලධාරිතුමාටත් ආහාර පාලක නිලධාරිතුමාටත් සමුපකාර කොමසාරිස්තුමාටත් 1968 අගෝස්තු මස 10 වන දා පහත සඳහන් විදුලි පුවත යැව්වා.

"වගා ණය නොගෙවූ ගොවීන්ගේ පවුලේ සහල් පොත් තහනමට ගන්නා බවට පැමිණිලි ලැබේ. මේ හාල් පොත් තහනමට ගැනීම නීති විරෝධි ක්‍රියාවකි. මාගේ ප්‍රදේශයේ ගොවීන්ගේ පවුල්වල හාල් පොත් අත්පත් කර ගෙන නීති විරෝධි ක්‍රියා නොකරන ලෙස නිලධාරීන්ට වහාම උපදෙස් දෙනු මැනවි. අලුත් හාල් පොත් නොදී වැලකීමද එසේම නීති විරෝධි බව සලකා සහකාර නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දෙන්න.—ප්‍රින්ස් ගුණසේකර, හබරාදුව මන්ත්‍රී."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළාතේ ආහාර පාලනයත් සමුපකාර ව්‍යාපාරයත් ගොවි ජන සේවා ව්‍යාපාරයත් ඒ සම්ගම පරිපාලන කටයුතු පිළිබඳව වග කියන දිසාපතිවරයාත් ඇතුළු නිලධාරීන් හැම දෙනාටම මා මේ විදුලි පණිවුඩය යැව්වා. මට පිළිතුරු ලැබුණේ ගාල්ලේ නියෝජ්‍ය ආහාර පාලක නිලධාරී මහතාගෙන් පමණයි. එම පිළිතුරෙහි, රජය එදා පිළිගත් ප්‍රතිපත්තිය ගැබ් වී තිබෙනවා. විදුලි පණිවුඩය යවන ලද අනෙක් නිලධාරීන්ගෙන් පිළිතුරු නොලැබුණත්, මෙම නිලධාරීන් ක්‍රියා කරන්නේ රජයේ ප්‍රතිපත්තිය අනුව තමන් ගත් පියවර නීත්‍යානුකූලය යන මතයෙහි පිහිටා බව, මට ලැබී තිබෙන මේ පිළිතුරෙන් වටහා ගන්නට පුළුවනි. 1968 අගෝස්තු මස 14 වන දා ගාල්ලේ දිසාපති කාර්යාලයෙන් එවන ලද එම ලියුම මෙසේයි :

" මගේ අංකය : එජ්එස්ටී.

ප්‍රින්ස් ගුණසේකර මහතා,
පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා,
හබරාදූව.

මහත්මයාණෙනි,

**සමුපකාර සමිතිවලින් කෘෂිකර්ම කටයුතු සඳහා දෙන ලද ණය මුදල් ආපසු ගෙවීම් පැහැර හැරිය අවස්ථාවලදී සහල් සලාක පොත් භාර දීම**

1968.8.11 දිනැති ඔබේ විදුලි පුවත සම්බන්ධවයි. වගා ණය ලබා ගන්නා ලද අය, ඒ ණය නො ගෙවූ අවස්ථාවලදී, ඔවුන්ගේ සහල් සලාක පොත් රජයට ගෙන ණය හිලව් කිරීම සඳහා සෑහෙන කූපන් සංඛ්‍යාවක් කපා හැරීමට හා 23 වන වාරයේ සහල් කූපන්, ණය හිලව් කිරීමට ප්‍රමාණවත් නො වන අවස්ථාවලදී, 24 වන වාරයේ සහල් පොත් ඔවුනට නිකුත් නොකර තබා ගැනීමටත්, ආහාර පාලන පනත යටතේ පළවූ අංක 14,776/7 හා 67.11.26 සහ අංක 14,790/4 හා 68.2.24 දින දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රවල රෙගුලාසි අනුව ක්‍රියා කළ හැකි බැව් දන්වා සිටිමි.

මෙයට,
යටහත් සේවක,
සී. අබේදීර,
ගාල්ලේ නි. ආ. පා. වෙනුවට.

1968.8.14 දින.

ගාල්ලේ දිසාපති කාර්යාලයේදී ය."

මෙම පිළිතුරෙන් කියැවෙන්නේ, ආහාර පාලක පනත යටතේ පැනවුණු නියෝග අනුව, ඇපයට තබන ලද හාල් පොත් ලබා ගැනීමටත් එය ප්‍රමාණවත් නොවේ නම් ඊළඟ වාරයේ හාල් පොත් නිකුත් නො කිරීමටත් මෙම නිලධාරීනට නීත්‍යානුකූලව බලය තිබෙන බවයි. අපේ අවබෝධය නම්, එවැනි නීත්‍යානුකූල අයිතියක් රජයට නැති බවයි. අපි එදා කී දේ හරි බව අද අවුරුද්දකට පස්සෙ ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති පනතෙන් කියා සිටිනවා. ඔය කියන ආහාර පාලන පනත යටතේ පනවන ලද නියෝගවල වලංගුතාවය සම්බන්ධයෙන් සැක ප්‍රකාශ කර තිබෙනවා. මේ පනතේ නීතිය බල පෑමේ ප්‍රකාශයේ 2 වැනි ඡේදයේ සඳහන් වන්නේ මෙසේයි :

" එබඳු නියෝගවල වලංගු භාවය සම්බන්ධයෙන් සැක ප්‍රකාශ කොට ඇති බැවින්, එබඳු බැඳුම්කරයක නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් ඒ අනුව සැක පහළ වී තිබේ."

වගා ණය ලබාගෙන ඇති ගොවීන්ගේ සලාක පොත් උදුරා ගැනීම නීති විරෝධී බවට අද සැකයක් පහළ වී තිබෙනවා. මේක නීති විරෝධිය, මේක කරන්න එපාය කියා අපි එදා කිව්වා. මෙතෙක් කල් කර ගෙන ගිය ඒ නීති විරෝධි වැඩේ නීත්‍යානුකූල කිරීමට ඉඩ දෙන්නය කියා ඇත් තමුන්නාන්සේ ඇවිත් කියනවා. එත කොට වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් අපි කී එක් කාරණයක් ඔප්පු වී තිබෙන බව මා ඇමතිතුමාට මතක් කරනවා. අනික් කාරණාත් තව අවුරුදු දෙකකදී තමුන්නාන්සේලාට ඔප්පු වෙනවා ඇති.

මෙය මා දේශපලාන ප්‍රයෝජනයක් ගැනීම පිණිස කියන කථාවක් නොවෙයි. මගේ පළාතේ සෑම කෙනෙකුටම ඇත්ත වශයෙන්ම මා කියා තිබෙනවා, මට කරන්න පුළුවන් සෑම උදව්වක්ම මම කරන්නම්ය, සෑම දෙනාම පුළුවන් තරම් වගා කරන්නය කියා. මා එසේ කියා ඇත්තේ තමුන්නාන්සේලාගේ වගා ව්‍යාපාරය කෙරෙහි ඇති දේශපාලන බියක් නිසාවත් මට එයින් පෞද්ගලික ප්‍රයෝජනයක් ගැනීම සඳහාවත් නොවෙයි. හාමතේ සිටින්නේ නැතුව කන්න ඕනෑ නිසයි. හාල් සේරු දෙකක් ශත 50 ට ලබමින් සිටි පිරිසකට එක හාල් සේරුවක් ලැබුණාට පස්සේ කොහොමද ඒ එක පිරිමහ ගන්නෙ ? ඒ මනුෂ්‍යයෝ මොනවා හෝ වගා කරගෙන ජීවත් වෙන්න ඕනෑ. අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

දරු මල්ලන් ඉන්න නිසා එහි ඇති අවශ්‍යතාව අපි දන්නවා. දරුවන් නැති නිසා අගමැතිතුමා වැනි උදවියට ඒ ගැන වේදනාවක් නැතුව ඇති. එහෙත් දරුවන් සිටින අප දන්නවා දරුවන් හාමතේ තබන්න බැරි බව. ඒ නිසා දරුවන් හාමතේ නොතබා මොනවා හෝ වගා කරගෙන කන්නය කියා අප නිතරම මහජනතාවට කියනවා. මට නම් වගා කරන්නට ඒ තරම් කාල වේලාවක් නැහැ. එහෙත් මාත් තමුන්නාන්සේලාගේ ඔය වගා ව්‍යාපාරයට සම්බන්ධ වී අල බතල වගා ව්‍යාපාර තරඟයට කෙළින්ම ඉදිරිපත් වීමෙන් මට ඒ තරඟයේ පළමුවෙනි තෑග්ගත් හිමි වුණා. එසේ වුණත් එක්සත් ජාතික පක්ෂය කියන පරිදි තමුන්නාන්සේලාගේ ඔය වගා ව්‍යාපාරය සාර්ථක වුණාය කියා මා අත්පුඩි ගසා කියන්න යන්නෙ නැහැ. එහි සාර්ථකයක් නැහැ. කොහොමද සාර්ථක වෙන්නෙ මේ විධියට නීති පනවන්නටත් සිදු වෙනවා නම්? එයින් පෙනී යන්නෙ වගා ව්‍යාපාරයේ අසාර්ථකත්වයයි.

ගොවියන්ට දුන් ණය ආපසු ගන්නට බැරුව සහල් සලාක පොත් උදුරා ගන්නට සිදු වෙනවා නම්, ආණ්ඩුව මෙතෙක් කල් රෙගුලාසියක් මගින් උදුරාගෙන ගිහින් ඒක නීති විරෝධි බව පෙනී දැන් අලුතෙන් නීතියක් පනවන්නට යනවා නම් ඒකෙන් පෙනී යන්නේ මේ වගා ව්‍යාපාරයේ යම් කිසි තැනක හුළං ගිහින් තිබෙන බව නොවේද? අපට ගුවන් විදුලියෙන් නම් නොයෙක් විට පැය භාගෙන් භාගෙට අසන්න ලැබෙනවා, අහවල් තැන වී වැපුරුවාය, දැන් හොඳට වැඩිගෙන එනවාය. අහවල් තැන ගොයම් කපනවාය, අහවල් තැන ගොයම් පාගනවාය ආදී නොයෙකුත් වගා විස්තර. පැය භාගෙන් භාගෙට ඔය ප්‍රචාරය කරනවා. බිජ වික වැපුරූ වෙලාව සිට ඒ ගොයම කපා පාගා මැනගෙන යන වේලාව වන තුරු ඇති ඔය මාස තුනහමාරේ කාල සීමාව ඇතුළත ගොයම් ගහේ සම්පූර්ණ ජීවිත කාලය පැය භාගෙන් භාගෙට ගුවන් විදුලියෙන් විස්තර වෙනවා. ප්‍රවෘත්ති පත්‍රත් ඒ වාගේයි. ගුවන් විදුලියටත් පත්‍රවලටත් පුළුවන්ද කුඹුරේ ගොවිතැන සාර්ථක කරන්න? ගුවන් විදුලියෙන් නිකුත් වන ඔය ශබ්දය අසා ගොවිතැන සාර්ථක වෙනවා නම්, පත්‍රවල පළ වන වාර්තා දැක ගොවිතැන සාර්ථක වෙනවා නම්, ඇත්ත වශයෙන්ම එය අපේ සන්තෝෂයට කාරණයක්. නමුත් එවැනි දෙයක් සිදු වෙන්නෙ නැහැ. ගොවිතැන සාර්ථක වෙන්නට නම්, වගා ව්‍යාපාරය සාර්ථක වෙන්නට නම්, ඒ සඳහා ගොවියාගේ සහයෝගය ලැබෙන්න ඕනෑ. තමුන්නාන්සේලාට ගොවියන්ගේ සහයෝගය ලැබෙනවාද? ගරු අගමැතිතුමාත් ගරු ආහාර ඇමතිතුමාත් දෙන්නට දෙන්නා මුහුණ බලාගෙන ඇසිය යුතු ප්‍රශ්නය ඒකයි. "වගා ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට අපට ගොවිජනතාවගෙන් සහයෝගය ලැබෙනවාද?" කියන ප්‍රශ්නය අහන්නට ඕනෑ. එතකොට ලැබෙන උත්තරය නම් කාටවත් ලැබෙන්නේ නැහැ යන්නයි. මේ විධියට කෘෂිකර්මය දියුණු කරන්නට බැහැ. [බාධාකිරීමක්] රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලකරත්න මයා.) ගොවිතැන් කරන හැටි නොදන්නවා නම් මා එතුමාට පුද්ගලිකව කියා දෙන්නම්. එහෙත් මේ කියන්නේ මෙවැනි පියවරවලින් නම් ගොවි ජනතාවගේ සහයෝගය ලබාගෙන කෘෂිකර්මය දියුණු කරන්නට බැරි බවයි. බැලූ බැල්මට ගොවි ජනතාවට පෙනී යා යුතුයි, තමුන්නාන්සේලා ඔවුන්ගේ යහපත සඳහා ක්‍රියා කරන පිරිසක් බව. බෙන්ස් එකකින්, හම්බර් එකකින් නැතිනම් පර්ජෝ 403 දරන කාරෙකකින් යන ඇමතිවරුන් කරන්නේ කුමක්ද? උදැල්ලක් රැගෙන ගොවීන් සමග කුඹුරට බැස ටික වෙලාවක් ඉඳලා යන්නට යනවා. වී වපුරන වෙලාවක ගියොත් එම යන්ත්‍රයකින් තවත් මොකවත් කරනවා. පැය බාගයක් පමණ කුඹුරට බැස ඉඳලා ඉර මුදුන් වෙන්නටත් පෙර කොහේ ගියාද දන්නේ නැති විධියට යන්නට යනවා.

**ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)**

*(கௌரவ ஹியூ பெர்னாண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)*

(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

ඇමතිවරයා කුඹුරේම ඉන්න ඕනෑද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
කුඹුරේම ඉන්නට ඕනෑය කියන එක නොවෙයි මේ කියන්නේ. තමුන්නාන්සේ කවදාවත් කුඹුරකට ගිහින් මඩ ටිකක් ගා ගත් කෙනෙක් නොවෙයි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
කුඹුරු වපුරන හැටි මම තමුන්නාන්සෙට උගන්වන්නම්. මම කටින් බතල කොළ හිටවන කෙනෙක් නොවෙයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඇමතිතුමා දන්න දේවල් කරුණා කර මට උගන්වන්නට එන්න එපා. මා කැමති නැහැ, ඒවා වැඩිපුර ඉගෙන ගන්න.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
ඒක බොහොම හොඳයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
එදා සදාචාරය ගැන ලොකු විග්‍රහයක් කළා. නාත්තණ්ඩියේ නාම යෝජනා දෙන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා තෝරා ගැනීමේදී කර තිබෙන වැරදි වගයක් ගැන කිව්වා. අළුත් වෙළඳ ඇමතිතුමා ඔය වැරද්ද මා සිතන්නේ එදා පමණක් නොවෙයි කීප සැරයක්ම කර තිබෙන බවයි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
මොනවාද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඒ කියන විධියේ තරක අපේක්ෂකයන් නාත්තණ්ඩිය ආසනයේ නාම යෝජනා දීම—එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විතරක් නොවෙයි එක්සත් ජාතික පක්ෂයත් කර තිබෙන බවයි මට දැන් පෙනෙන්නේ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
කොහේද කියන්න. නම කියන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔය කරුණු මේ කතාවට අදාළ නැහැනෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ කතාවට ටිකක් ඇදී ආව නිසයි කියන්නට හැදුවේ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
බාගයක් කියා නතර කරන්නට එපා. හරියට කියන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සදාචාර වගාවත් වී වගාවත් යන දෙකේ සම්බන්ධය ටිකක් පෙන්වන්නයි හැදුවේ. මා කිව්වේ දැන් එතුමා දන්න වගා ව්‍යාපාරය ගැන මා වැඩිය ඉගෙන ගන්නට කැමති නැති බවයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
අපි ආපසු ප්‍රශ්නයට යමු.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ජනතාවගේ හිත තමුන්නාන්සේලාගේ වගා ව්‍යාපාරය කෙරෙහි බැඳ ගැනීමට නම් මීට වඩා අවංකව පියවර කීපයක් ගන්නට සිදු වී තිබෙනවා. වෙළඳ ඇමතිතුමා කියන විධියට අමැතිවරු හැම වෙලේම මඩේ ඉන්න ඕනෑ යයි මා කියන්නේ නැහැ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
මා එහෙම කිව්වේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කියපු එකයි මා කිව්වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඒක නොවෙයි මම කියන්නේ. ගොවි ජනතාව වටපිට බලන විට අවංකවම ඔවුන්ට පෙනී යා යුතුයි පාලකයන් සහ ගොවි ජනතාව අතර මෙම කටයුත්තෙහිදී වෙනසක් නැති බව. ගොවි ජනතාවටත් පාලකයන්ටත් කියන දෙකොටසටම වුව මනා කරන්නේ එකම වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවන්නට බව අවබෝධ විය යුතුයි. එම කාරණය ඉටු කර ගැනීම සඳහා පාලකයන් සමග අත්වැල් බැඳ ගැනීමට ගොවි ජනතාව නිතරම සූදානම් බව කියන්නට ඕනෑ. ඈත පිටිසර කුඹුරක ඉඳගෙන දුක් විඳින දුප්පත් ගොවියා ජීවත් වන අන්දමත් නගරබදව ගරු ඇමතිවරුන් ජීවත් වන අන්දමත් දෙස බලන විට ඒ ගැන හැඟීමක් ඇති වෙනවාද? අද තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුව මේ දෙගොල්ලන් අතර ඇති පරතරය අහසත් පොලොවත් හා සමානයි. ඈත පිටිසර කුඹුරු ගොවිතැනින් ජීවත්වන ගොවියකුට කවදාවත් නගරයේ ජීවත්වන ඇමතිවරුන් ගත කරන සුඛෝපභෝගී ජීවිත ගත කරන්න පුළුවන්කමක් නැහැ. ඒ උදවියගේ දරුවන් හැමදාමත් ගමේ දුප්පත් ඉස්කෝලෙට යන්න ඕනෑ. ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ දරුවන්ට මෙන් කොළඹ ශාන්ත තෝමස්, රෝයල් වැනි විද්‍යාලවලට යන්න අවකාශ ලැබෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

සේරම ගොවියන් ඇමතිවරුන් වුණොත් කුඹුරු පාළු වී යනවානෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගොවි රජවරුන් පාර්ලිමේන්තුවට එවනවායයි කියනවා. මේවායින් රවටෙන්නේ කව්ද? තමුන්නාන්සේලාට හැමදාමත් ගොවිජනතාව රවටන්න පුළුවන්යයි කල්පනා කරනවාද? ඩඩ්ලි සේනානායක මහතා ප්‍රමුඛ ආණ්ඩුව ගොවි ජනතාවට මුල් තැන දුන්නාය, ගොවි රජවරුන් ඉදිරියට ගත්තාය කියා සමහර පත්‍රවල පළ වෙනවා. ඒ අතරම ලබන මහා මැතිවරණයේදී ගොවි රජවරුන් ඉදිරිපත් කරන්න යනවායයි කියනවා. ඒවාත් එක්තරා අන්දමක රැවටිලි බව මතක් කර දෙන්න කැමතියි. කවදාවත් කුඹුරකට බැස නැති කලිසම්කාර ගොවි රජවරු ඉන්නවා. අමුඩය ගහන්නවත් දන්නෙ නැති ගොවි රජවරුන් හබරාදුව ප්‍රදේශයෙත් ඉන්නවා. කෙසේ වුණත් මෙය අපේ ආහාර ඇමතිතුමාට තනියෙන් කරන්න පුළුවන් දෙයක්යයි මා හිතන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම කෘෂිකර්මය දියුණු කිරීම සඳහා ගොවි ජනතාවගේ අවංක සහයෝගය, අකලංක සහයෝගය ලබා ගැනීමට නම් බරපතල දාර්ශනික විප්ලවයක් කරන්න ඕනෑ බව මතක් කර දෙන්න කැමතියි. මේ ආණ්ඩුවට පමණක් නොවෙයි, කවර ආණ්ඩුවක් බලයට පැමිණියත් ඒ ගොවි ජනතාවගේ සහයෝගය ලබා ගන්න නම් මා සඳහන් කළ අන්දමේ දාර්ශනික විප්ලවයක් කළ යුතුමයි. එසේ නැතුව මේ වාගේ පැලැස්තර ඇලවීමෙන් කවදාවත් එම සහයෝගය ලබාගන්න පුළුවන්කමක් නැති බව මතක් කර දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අමුඩය ගසා හැමදාමත් කුඹුරට බැස මඩ කමින් ජීවත්වීමට ගොවි ජනතාවට සිද්ධ වෙනවා. නමුත් මෙම පාලක පක්ෂය උසස් තත්ත්වයක මහේශාක්‍ය තත්ත්වයක වැජඹෙනවා. ඔය දෙගොල්ලන් අතර ඇති පරතරය මේ අන්දමට තිබෙන තුරු කුඹුරට බැස මහන්සි වී අවංකව මෙම ප්‍රශ්නය විසඳන්න ගොවියන් උත්සාහයක් දරන්නේ නැහැ. මේ සමාජ ක්‍රමය යටතේ තබා ලෝකයේ පළමුවන සමාජවාදී රටයයි කියන රුසියාවේවත් මේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණා. එක් දහස් නවසිය තිස් ගණන්වලදී රුසියාවේ අලුත් නියෝගයක් නිකුත් කළා, සාමූහික ගොවිපලවල් ඇති කිරීම පිණිස. තමුන්නාන්සේලාගේ ජනසම්මත වාදී රජය මඟින් ව්‍යාපාර මෙහෙයවන්නා වාගේම ඒ රටේත් කෘෂිකාර්මික ප්‍රශ්නය විසඳන්න, ආහාර ප්‍රශ්නය විසඳන්න ඒ උදවිය ගත් පියවර නම් සාමූහික ගොවිපළවල්—Collective Farms—පිහිටුවීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් එය සාර්ථක වුණාද? අද තමුන් නාන්සේලාගේ ආදායම් පාලක නිල ධරින්, ග්‍රාම සේවක මහතුන්, ආහාර පාලන නිලධාරින් යවා ණය ගෙවා ගන්නට බැරිවුණු ගොවියාගේ සහල් පොත උදුරා ගන්නවා වාගේම, එදා සමූහික ගොවිපලවල් පිහිටුවා වගා කර, අස්වැන්න කපා ගන්නා කාලය වන විට, ඔවුන්ගේ අස්වැන්න රජයට බලහත් කාරයෙන් පවරා ගැනීම සඳහා සමාජවාදී රජයේ නිලධාරින්ට යන්න සිදු වුණා. එදා, ගොවියන් අඳෝනා නගද්දී, ඔවුන්ගේ දරුවන් බඩගින්නේ අඬද්දී, කන්නට ඇති දේ ගෙන යන්න එපායයි කෑ ගසද්දී, ඔවුන් වගා කළ දේ ගෙන ගියා; ඔවුන් ඇති කර ගත් ඌරන්, බැටළුවන් හරකුන් පවා දක්කාගෙන ගියා. එය ගොවියා නැති කරන ඒකාධිපතිවාදී භයානක සිද්ධියක් හැටියට තමුන් නාන්සේලා හඳුන්වා දී තිබෙනවා. හොඳයි, ජන සම්මතවාදී තමුන්නාන් සේල කරන්නේ මොකක්ද? අද වතුර නැතිව කුඹුරු පාළු වී යෑම නිසා ණයට ගත් මුදල් ටික ගෙවා ගන්නට බැරිවුණු ගොවියන්ගේ හාල් පොත් ටික උදුරා ගැනීමත්, එදා රුසියාව කළ දේත් අතර වෙනසක් තිබෙනවාද? මේක සිදු වන්නේ ජන සම්මතවාදී යයි කියන මහජන ආණ්ඩුවක් යටතේ. එදා ඒක සිදු වුණේ ඒකාධිපති යයි කියන සමාජ වාදී ආණ්ඩුවක් යටතේ. ඉතින් මේ ක්‍රියා දෙකේ වෙනස මොකක්ද? දෙකම එකයි. අපේ ගොවියා තළා පෙළන්නට හදන්නේ ඔහුගේ වරදක් නිසා නොව; ස්වභාව ධර්මය නියම වේලාවට ඔහුගේ පිහිටට නොපැමිණි හෙයින් නියම අස්වැන්න නෙළා ගන්නට බැරි වීමෙන්, ඔහු ලබා ගත් ණය ආපසු ගෙවීමට නොහැකි වීම නිසයි. ණය ගෙවන්නට තරම් ආදායමක් නැතිව අමාරුවේ වැටුණු ගොවියාගේ හාල් සලාක පොත මේ විධියට බලහත්කාරයෙන් ගැනීම මොන සාධාරණයක්ද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වගා ව්‍යාපාරය සාර්ථක වී ඇත්තේ හාල් සලාකයෙන් සේරුවක් කපා දැමීම නිසා යයි සමහරුන් කියනව. මේක පුදුම කථාවක්. මිනිසුන් බඩ ගින්නේ තැබූ පලියට රටක් සංවර්ධනය වෙනවාද? හාල් සේරු දෙක බැගින් දීම නිසා රට සංවර්ධනය වුණේ නැතිලු. මේ කියන්නේ මොනවාද? රෝගය තිබෙන්නේ වෙන තැනකයි. රෝගය තිබෙන තැන සොයා ප්‍රතිකාර නොකර රට මුළා කරන්නට හදන්නේ ඇයි? හාල් සේරු දෙකක් ලැබුණු මිනිසාට එකක් ලැබෙන විට බඩ ගින්නේ ඉන්නට බැරිව අල බතල ටිකක් වවා ගන්නට, එසේ නැත්නම් පුරන් වී තිබුණු කුඹුරු කෑල්ලක් වගා කර ගන්නට, යම්කිසි දෙයක් නිපදවන්නට හදන බව ඇත්තයි. එහෙත් එයත් කෘෂි කර්ම සංවර්ධනයත් අතර තිබෙන වෙනස මේ පාලකයන්ට සොයා ගන්නට බැරිද? වගා ව්‍යාපාරය පිළිබඳව ගෙන යන්නා වූ ප්‍රචාරය ඕනෑවට වඩා පුප්පා පෙන්වීමක් බව අප කියන විට එය සම්ච්චලයට ලක් කරනවා. ඇත්ත වශයෙන් සියයට 75 ක සාර්ථකත්වයක් තිබෙනවා නම්, සියයට 75 කින් රට ස්වයංපෝෂිත වන ලකුණු පහළ වී තිබෙනවා නම්, අද ගම්බද ප්‍රදේශවල මේ තරම් දරිද්‍රතාවක් තිබෙන්නේ ඇයි? ටිකක් වට පිට සොයා බලන්න. ගොවීන් අතට එක්තරා මුදල් ප්‍රමාණයක් ලැබුණු බව සැබෑවයි. එදාට වඩා වැඩි මුදල් ප්‍රමාණ ලැබුණු බවත් සැබෑවයි. එහෙත් කෘෂිකර්ම සංවර්ධනය නිසා ගොවි ජනතාව බලවත් දියුණුවකට පත් වුණා යයි කියමින් තමන්ම රවටා ගන්නට හදන්නට එපා. එදා වී බුසලකට රුපියල් 12 ක් ලැබුණු අතර අද රුපියල් 14 ක් ලැබෙනවා. හැබැයි, රුපියලේ අගය සියයට 20 කින් අඩු කර තිබෙන බව අමතක කරන්නට එපා. ඒ අනුව බලන විට ගොවියාට එක් වී බුසලකට රුපියල් 14.40 ක් ලැබිය යුතුයි. එහෙත් දැන් දෙන්නේ රුපියල් 14 යි. එතැනිනුත් ශත 40 ක් කපාගෙන තිබෙනවා. මේක ආත්ම වංචාවක්; මේක තමන්ම රවටා ගැනීමක්. කෘෂිකර්මය අතින් හෝ වෙනත් විෂයයක් අතින් හෝ ඔය කියන විධියට බරපතල දියුණුවක් මේ රටේ ඇති වී නැහැ. එක්තරා පිබිදීමක් තිබෙන බව නම් සැබෑවයි. එහෙත් රටේ බරපතල කෘෂිකර්ම සංවර්ධනයක් තිබෙනවා යයි එයින් අපම රවටා ගන්නට වටින්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තමුන්නාන්සේලාගේ වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය නඟන එක චෝදනාවක් සත්‍ය බව මේ පනත නිසා දුන් තමුන්නාන්සේලාට පිළි ගන්නට සිදුවී තිබෙනවා.

අනික් චෝදනාව මෙයයි: එතරම් සාර්ථක තත්ත්වයකට පැමිණ නැති මේ වගා ව්‍යාපාරය සියයට සියයක්ම සාර්ථකය කියා තමුන්නාන්සේලා ගෙන යන ප්‍රචාරයෙන් මේ රටේ කිසිම කෙනෙක් රැවටෙන්නේ නැහැ. ඒ බව තව අවුරුදු 2ක් ඇතුළත තමුන්නාන්සේලාට ඒත්තු යනවා ඇති. මේ යෝජනා කර තිබෙන නීතියට, රටේ බලපවත්වන අනිකුත් පොදු නීතියට සම්පූර්ණයෙන්ම, එකහෙලාම, විරුද්ධ ප්‍රතිපත්ති රාශියක් ඇතුළත් වී තිබෙනවා. එක් කෙනෙක් ගන්නා ණයක් නිසා තවත් කෙනෙකු සන්තක දේපොළක් අයිති කර ගැනීමට පුළුවන්කමක් නැහැ. වෙන එකක් තබා යම්කිසි කෙනෙක් උසාවිය මගින් ණය කාරයෙක් වුණත්—ණය කාරයෙක්ය කියා තීන්දු වුණත්—ඔහු සනත්ක යම්කිසි වස්තු කිහිපයක් ණයට යටත් කර ගැනීමට බැරි හැටියට නීතියක් තිබෙනවා. නීතියෙන්ම එවැන්නක් පණවා තිබෙනවා. නමුත් ඒ නීතියටත් පටහැනිව —නීති සංග්‍රහයේ ඇතුළත් වී තිබෙන ඒ නීතියත් කඩා ගෙන—මේ වගා ව්‍යාපාරයට කර දී සිටින ගොවියන්ගේ හාල් පොත් ටික උදුරා ගැනීමට පනවන මේ නීතියට විරුද්ධත්වය පළ කළ යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර ඇමතිතුමා ඉදිරිපත් කළ මේ විශේෂ විධිවිධාන පනතේ 3 වැනි වගන්තියෙන් යෝජනා කර තිබෙන දේපොළ අත්පත් කර ගැනීම රටේ අනිකුත් දේපොළ අත් පත් කර ගැනීමේ නීතියට සම්පූර්ණයෙන්ම, හාත් පසින්ම විරුද්ධයි. මෙය නීති විරෝධි නිසා පමණක් නොව, අයුක්ති සහගත අසාධාරණ යෝජනාවක් නිසාත්, එක එල්ලේම තමන්ගේ වගකීමක් පැහැර හැරීම නිසා නොව, නියම වේලාවට—කලට වේලාවට —වතුර ලැබෙන්නේ නැතිකම නිසා, පාලු වුණ කුඹුරක් වැඩ කළ ගොවියෙකුගේ හාල් පොත උදුරා ගැනීම අයුක්ති සහගත අසාධාරණ ක්‍රියාවක් නිසත්, මෙවැනි නීති විරෝධි අයුක්ති සහගත අසාධාරණ නීති වලට අපට කොටස්කාරයන් වීමට බැරි නිසාත්, අපි මෙයට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මා නැවත වරක් කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ ගොවියන් පෙළීමේ නීතිය නීතිගත කිරීම ගැන තව දුරටත් සලකා බලන්නය කියායි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Mr. Deputy Chairman, I understand that the Hon. Minister of Local Government has certain non-controversial by-laws to be moved. Therefore, at this stage I agree to the Debate being adjourned.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move, "That the Debate be now adjourned".

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
එතැන් සිට විවාදය 1969 මැයි 3 වන **සෙනසුරාදා** පවත්වනු ලැබේ.

அதன்படி விவாதம் ஒத்திவைக்கப்பெற்றது. 1969 மே 3, சனிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*The Debate stood adjourned accordingly.*

*Debate to be resumed on Saturday, 3rd May* 1969.

## අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

මහා தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I have received the following Message from His Excellency the Governor-General:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය,

රජ මැදුර,
මහනුවර,
ශ්‍රී ලංකාව.
1969 අප්‍රේල් 28.

මහත් මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත් වලට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි:

1. 'An Act to make provision for the recovery of possession of quarters provided by or on behalf of the Government for the occupation of persons, and for matters connected therewith or incidental thereto.'

2. 'An Act to amend the Local Government Service Pensions (Special Provisions) Act, No. 59 of 1961.'

3. 'An Act to amend the Ayurveda Act, No. 31 of 1961.'

මේ වගට,
ඔබගේ කීකරු සේවක,
ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ
ගරු කථානායකතුමා. "

## පළාත් පාලන අතුරු ව්‍යවස්ථා
### உள்ளூராட்சி உப விதிகள்
### LOCAL GOVERNMENT BY-LAWS

ගරු ප්‍රේමදාස
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
I move,

"That the by-law relating to the contravention of by-laws made by the Weligama Urban Council under Sections 153 and 157 of the Urban Councils Ordinance (Chapter 255), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,790 of 23.2.1968, which was presented on March 20, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

පළාත් පාලන අතුරු ව්‍යවස්ථා

ගරු ප්‍රේමදාස
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
I move,

"That the by-law relating to the exemption of certain properties from special conservancy rate for the year 1968 made by the Galewela Town Council under Sections 129 (b) and 152 of the Town Councils Ordinance (Chapter 256), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,826 of 1.11.1968, which was presented on March 20, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ගරු ප්‍රේමදාස
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
I move,

"That the by-law relating to the exemption of certain premises from special conservancy rate for the year 1967 made by the Lunugala Town Council under Sections 129 (b) and 152 of the Town Councils Ordinance (Chapter 256), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,776 of 23.11.1967, which was presented on March 20, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ගරු ප්‍රේමදාස
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
I move,

"That the by-law relating to the dangerous and offensive trades made by the Talawakelle-Lindula Urban Council under Sections 153 and 157 of the Urban Councils Ordinance (Chapter 255), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14.814 of 9.8.1968, which was presented on March 23, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I move,

"That the by-law relating to the exemption of every paddy field from the special conservancy rate for 1968, made by the Vavuniya Urban Council under Sections 130 (b) and 153 of the Urban Councils Ordinance (Chapter 255), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,823 of 11.10.1968, which was presented on April 26, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I move,

"That the by-laws relating to the advertisements made by the Warakapola Town Councils under Sections 152 and 156 of the Town Councils Ordinance (Chapter 256), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,825 of 25.10.1968, which were presented on April 26, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I move,

"That the by-law relating to the market area made by the Special Commissioner, Wattala-Mabole Town, under Sections 153 and 157 read with Section 184 of the Urban Councils Ordinance (Chapter 255), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,811 of 19.7.68, which was presented on April 26, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*



ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

I move,

"That the by-law relating to the dust bins made by the Rambukkana Town Council under Sections 152 (1) and 156 of the Town Councils Ordinance (Chapter 256), approved by the Minister of Local Government and published in the Government Gazette No. 14,795 of 29.3.68, which was presented on April 26, 1969, be not disallowed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" (கௌரவ ஜே. ஆர். ஜயவர்தன) எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,* "That the House do now adjourn".—[*The Hon. J. R. Jayewardene*].

එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අග මැතිතුමාට කල් දී තිබෙන ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. ඊයේ මේ ගරු සභාව තුළ ගරු අගමැතිතුමා කළ ප්‍රකාශයක් අනුව දේශපාලන ස්වරූපයක් ඇති පෙළ පාලි සහ රැස්වීම් මැයි පළමුවැනිදා පැවැත් වීම පොලීසිය විසින් තහනම් කර ඇත. එවැනි වූ අයිතියක් පොලීසිය තමන්ටම ලබා ගත්තේ මේ රටේ බල පවත්වන කුමන නීතියක් යටතේද යන්න ගරු අග මැතිතුමා මේ ගරු සභාවට දන්වනවාද? අපි වේගයෙන් දේවාධිරාජ්‍යයක් බවට වෙනස් වෙමින් තිබෙනවාවත්ද?

සිදුවේයැයි සැක සිතන නොව, නියත වශයෙන්ම සාමය කඩවීමක් ඇති වූ විට පමණක් පොලීසියට රැස්වීම් සහ පෙළපාලි පැවැත්වීම තහනම් කළ හැකි නමුත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

එසේ නොමැතිව පොලීසියට එවැනි කිසිම බලතල පැවරී නැති බවත් ගරු අගමැතිතුමා දන්නවාද?

පසුගිය සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මාවගේ ආණ්ඩුව පවතිද්දී ගරු අගමැතිතුමා සහ ගරු රාජ්‍ය ඇමතිතුමාත්, පොලීසියේ අවසරයක් නොමැතිව ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කළ බවත්, ඒ දෙපොළම උසාවියෙන් ඒ වරදින් නිදහස් කළ බවත් ගරු අගමැතිතුමා දන්නවාද?

වත්මන් ගරු රාජ්‍ය ඇමතිතුමා 1957 දී බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධව අර අපකීර්තිමත් නුවරට "පයින් ගමන" කෙළේ පොලීසියේ අවසරයක් නොමැතිව බව ගරු අගමැතිතුමා දන්නවාද?

ආණ්ඩුවේ උසස්ම මට්ටමේ සාමාජිකයන්ට ඔවැනි අයිතිවාසිකම් භුක්ති විඳීමට හැකි වුණා නම්, අද වෙන අයටත් ඒවා අයිති නැද්ද?

වෙසක් දිනයේදී කිසිම දේශපාලන පෙළපාලියක් හෝ රැස්වීමක් හෝ පැවැත්වීමට ඉඩ නොදෙන බව කොළඹ පොලිස් අධිකාරී කොළඹ නගර සභාවට දන්වා තිබෙන බවත්, ඒ හේතුවෙන් කොළඹ නගර සභාව ඊට කලින් මැයි දිනය පැවැත්වීමට සංවිධානවලට දී තිබුණු සෙල්ලම් පිටි ප්‍රයෝජනයට ගැනීමේ අවසරය දුන් ඉවත් කර තිබෙන බවත් ගරු අගමැතිතුමා දන්නවාද?

මෙතැනදී පොලීසිය ක්‍රියා කෙළේ කුමන නීතියක් යටතේද යන්න ගරු අගමැතිතුමා පැහැදිලි කරනවාද?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardane)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නයක් අහන්නට බලාපොරොත්තුව වෙනවා. මීට දවස් තුනකට පෙර කල් දෙන ලද ප්‍රශ්නයක් මෙය. එහෙත් වැරදීමක් නිසා මට එදා මේ ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අහන්නට බැරි වුණා. සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අද පැමිණ සිටින නිසා මේ ප්‍රශ්නය දැන් ඉදිරිපත් කරන්නට මා අදහස් කළා. එතුමා ඒ ගැන වචනයක් දෙකක් කියනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පානදුර රෝහලට අවශ්‍ය බෙහෙත් වර්ග ගණනාවකම හිඟයක් තිබෙන බව පැහැදිලිවම පෙනී යනවා. විශේෂයෙන් අවශ්‍ය බෙහෙත් රාශියක් තිබෙනවා. මා කරුණු ඉදිරිපත් කරන්නේ ඒවා මට දැනගන්නට ලැබුණු ආකාරයටයි. මට ලැබෙන ආරංචිවල හැටියට මා ඉදිරිපත් කරන කරුණු ගැන වඩාත් පැහැදිලි තොරතුරු ගරු ඇමතිතුමාට වෛද්‍යවරුන්ගෙන් දැනගන්නට පුළුවන් වෙනවා ඇති. අපට එතැන පවතින නියම තත්ත්වය එතැන සේවය කරන වෛද්‍යවරුන්ගෙන් දැනගන්නට අමාරුයි. ඒ අය විරුද්ධ පාර්ශ්වයේ අපට ඇත්ත තත්ත්වය කියන්නට බියයි. පසුව දොස් අහන්නට සිදු වෙතැයි බියක් ඔවුන් තුළ පවතින නිසා ඔවුන්ගෙන් අපට යමක නියම තත්ත්වය අසා ගන්නට බැහැ. ඒ නිසා අනියම් ක්‍රමවලින් මම යම් යම් තොරතුරු සොයාගෙන තිබෙනවා. කෙලින්ම ඇහුවට කියන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට ආරංචිය දුන්නොත් මතුවට සිදු විය හැකි දේ ගැන ඔවුන් කල්පනා කරනවා.

විශේෂයෙන් අවශ්‍ය බෙහෙත් වර්ග තුනක් සම්බන්ධයෙන් බරපතල ලෙස හිඟයක් පවතිනවා. ස්ට්‍රෙප්ටොමයිසින්, ඉන්සියුලින් සහ ෆේපනගන් යන මේ බෙහෙත් වර්ග තුනයි ඒ.

මට මේ සම්බන්ධයෙන් තවත් කාරණයක් දැන ගන්නට ලැබී තිබෙනවා. කලුතර, නාගොඩ රෝහල්වලින් ද මේ බෙහෙත් වර්ග බෙදන්නේ ඉස්සර වාගේ නොවෙයි. කලුතර, නාගොඩ රෝහල්වලටත් මේවා ලැබී නැතැයි කියනවා. ඒ නිසා කලුතර දිස්ත්‍රික්කයේ හැම රෝහලකම වාගේත් නොයෙක් අඩුපාඩුකම් තිබෙනවා, වෙන්නට ඕනැ. ඒ ගැන ඇත්ත තත්ත්වය පෙන්වා දී අපට කරුණු දැන ගන්නට සලස්සන මෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. අමිර්තලිංගම් මයා. (වඩ්ඩුක් කොඩෙයි)**
*(திரு. எ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)*
(Mr. A. Amirthalingam—Vaddukkoddai)

கௌரவ உப தலைவர் அவர்களே, கௌரவ உணவு, விவசாய அமைச்சர் அவர்களுடைய கவனத்துக்கு ஒரு விஷயத்தை நான் கொண்டுவர விரும்புகின்றேன். இவ்வாண்டு மழையின்மை காரணமாக யாழ்ப்பாண மாவட்டத்தில் நெற்செய்கை மிகவும் பாதிக்கப்பட்ட தென்பதை கௌரவ அமைச்சர் அறிவார். அதனால் நெற்செய்கையில் ஈடுபட்ட விவசாயிகள் விதை நெற்கூட இல்லாது மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறார்கள். இன்னும் சில மாதங்களில் மீண்டும் அவர்கள் அந்த வயல்களை விதைக்க வேண்டியவர்களாக இருக்கிறார்கள். அதற்கான காலமும் நெருங்கிக் கொண்டிருக்கின்றது. அதனாலேயே இந்தக் கட்டத்தில் அவர்களுடைய நிலையைக் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வந்து, அவர்களுக்கு விதை நெல்லையாவது விநியோகிக்க அரசாங்கம் ஏற்பாடு செய்யவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

ஒருசில வயல்களில் சில கமக்காரர்கள் நெல்லைப் பெற்றாலும் அந்த நெல் போதிய அளவு முதிர்ச்சியுறாததன் விளைவாக, விதை நெல்லுக்கு அது ஏற்றதாக இல்லாத காரணத்தால் யாழ்ப்பாண மாவட்டத்தில் விதை நெல்லுக்கு மிகவும் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது. உணவுற்பத்தியில் அதிக அக்கறையோடு கவனம் செலுத்தும் ஓர் அரசாங்கத்தின் அமைச்சர் என்ற முறையில், வட பகுதி மக்களுக்கு ஏற்பட்டிருக்கும் இந்த இன்னலைத் தீர்க்க அவர்களுக்கு மிக விரைவில் விதை நெல்லை வழங்க கௌரவ விவசாய, உணவு அமைச்சர் ஏற்பாடு செய்யவேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)

ගරු අගමැතිතුමාට මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මේ වන තෙක් මැයි දින රැළිය සම්බන්ධව ප්‍රචාරක කට යුතු කරන්නට පොලීසියෙන් අපට ශබ්ද විකාශන යන්ත්‍ර අවසර පත්‍රයක් ලැබුණා. කොලොන්නාව, කොටිකාවත්ත, ආදී වශයෙන් අභ්‍යන්තර ප්‍රදේශවල ප්‍රචාරක කටයුතු කරන්නට එවැනි අවසර පත්‍රයක් ලැබුණා. නමුත් මේ වාරයේ එසේ ප්‍රචාරක කටයුතු කිරීමට අවසර පත්‍රයක් දෙන්නට බැරිය කියා පොලීසියෙන් කිව්වා. ඒ ගැන මා පැමිණිල්ලක් කරනවා නොවෙයි. මේ සම්බන්ධයෙන් පොලීසිය අප සමග සාකච්ඡා කර හුඟක් සහයෝගයෙන් කටයුතු කළා. මේ අවස්ථාවේදී මා මතක් කරන්නේ මීට කලින් තිබුණු ඒ අයිතිවාසිකම ලබන වර්ෂයේදීවත් රැක දෙන ලෙසයි. ඔබතුමාට ඒ පිළිබඳව උපදෙස් දෙන්නට පුළුවනි. මෙතෙක් ප්‍රාදේශීය වශයෙන් අවසර පත්‍රයක් දීගෙන ආවා. මේ අවුරුද්දේ ඒක ලැබී නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

කාටත් නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)

කාටත් නැහැ. අප රණ්ඩුවක් කරන්නේ නැහැ. නමුත් ඒ ගැන සලකා බලා ඒ තිබුණු අයිතිවාසිකම නැවතත් ලබා දුන්නොත් අප සතුටු වෙනවා.

ඊළඟට සෞඛ්‍ය ඇමතිතුමාට ඉදිරිපත් කළ යුතු ප්‍රශ්නයක් තිබෙනවා. මේ කාරණය සම්බන්ධව මා දෙපාතීමේන්තුවට ලියුම් කිපයක් යවා තිබෙනවා. කොටිකාවත්තට සෞඛ්‍ය නිලධාරීන්—පී. එච්. අයි. වරුන්—සිටින්නේ දෙදෙනායි. එක් කෙනෙකු 46,000 ක පිරිසක් රැක බලා ගන්නට ඕනෑ. අනික් තැනැත්තා 36,000 ක පිරිසක් රැක බලා ගන්නට ඕනෑ. ගරු ඇමතිතුමාගේම සංඛ්‍යා ලේඛන අනුව ඒ ප්‍රදේශයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෞඛ්‍ය නිලධාරීන් හය දෙනෙකු සිටින්නට ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ මේ තත්ත්වය පිළිබඳව මා ලියුම් ගනුදෙනු කරගෙන යනවා. නමුත් මේ දක්වා උත්තරයක් ලැබී නැහැ. ඒ ගැන කරුණාකර සොයා බලන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

The police banned political meetings and processions on Wesak Day, 1st May, under the provisions of the Police Ordinance for the preservation of public order. The relevant section is Section 77, sub-section (3).

On Wesak Day Colombo is thronged by large crowds of people moving about from place to place. It is necessary to utilize a large strength of police to divert traffic, control crowds and perform other police functions of preventing crime, etc.

Since Wesak Day is observed all over the Island, it is not possible for Colombo to get the assistance of men from outstations. In addition to this large commitment, it is not possible for the police to take over the responsible commitment of supervising political processions and meetings on this day.

Since strong objections were raised regarding the holding of political meetings and processions on Wesak Day, it was considered inexpedient to allow political meetings and processions on this day. Police had very good reasons to anticipate breaches of the peace if these processions and meetings were allowed and, therefore, exercised the powers granted under the Police Ordinance to ban any political meetings and processions.

It is correct that the police cannot ban a meeting or a demonstration unless they apprehend a breach of the peace. In this instance, police anticipated a serious breach of the peace and exercised their rights under the provisions of the Police Ordinance.

Then as regards myself and the Hon. Minister of State, and I think the Hon. Minister of Local Government, who defied a ban on loudspeakers, the matter was thrashed out in the courts, and I request the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) to read that judgment and see why we were acquitted.

Then about the march of the Hon. Minister of State to Kandy, it is correct that this procession did not have the permission of the police nor the protection of the police. The procession moved a great way in spite of obstruction and came to a halt when the questioner himself obstructed the road and the police intervened and prevented a breach of the peace. I do not know what other offence the police prevented by doing so because the hon. Member was lying on the road.

Then the final question was: "Is the Hon. Prime Minister aware that the Superintendent of Police, Colombo, has communicated to the Colombo Municipality that all political meetings and processions would not be allowed on Wesak Day...?" This is correct. As indicated earlier, the police acted in terms of the provisions of the Police Ordinance, Chapter 53, Sections 77 to 80.

Then as regards the question by the hon. Member for Kolonnawa (Mr. Illangaratne), who said he had not given me any notice of it, I presume—I am merely presuming; I have not asked the police for reasons—that if loudspeakers are allowed there may be some difficulty about using the loudspeakers for political purposes. However, I shall look into the matter.

The hon. Member has made a request that next year this privilege be granted. I am glad he presumes that we shall be here next year too.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

In the Northern Province, particularly in the Jaffna District, failure of crops, particularly paddy, has been rather widespread.

It is the policy of the Government to issue free seed paddy if there had been three successive crop failures. In this case the loan facilities for these people will be extended and they will be getting fresh loans for agricultural purposes, particularly for the purchase of seed paddy. Those instructions have already been sent. I do not know whether they can get seed paddy there. I have instructed the department to see whether they can supply some seed paddy. They will have to pay for it. For this they will get a loan.

ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)
(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)
(The Hon. E. L. Senanayake—Minister of Health)

Two days ago the hon. Member for Panadura (Mr. Leslie Goonewardene) raised the question of the shortage of two drugs in the Panadura Hospital.

In regard to Phenergen, I immediately sent an assistant director and it was found that that drug was not available, but a substitute, Benadryl, was available.

There has been an islanwide shortage of insulin, not soluble insulin but insulin lente which is a very quick-acting drug. It is date-marked and large quantities of this drug are not imported by druggists and the Civil Medical Stores. After the date of validity the drug is useless. But insulin has arrived and I have supplied the Panadura Hospital with a half-year quota.

About the Kalutara Civil Medical Stores, we are supplying them with stocks for the next three months.

In regard to these matters, I have already written to the hon. Member giving the facts and figures.

Regarding the matter raised by the hon. Member for Kolonnawa (Mr. Ilangaratne), I shall look into it and increase the strength.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගම්පහ මන්ත්‍රී නුවර ගමන වළක්වන්නට පාරේ නිදා ගත්තාට පසුව බණ්ඩාරනායක අගමැතිතුමා ගම්පහ මන්ත්‍රීට ඉඹුල්ගොඩ බූරුවා නොහොත් දඟසිය බෝනික්කා යයි කියූ බව දන්නවාද ?

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 4.37ට, 1969 මැයි 3 වන සෙනසුරාදා අ. භා. 2 වන තෙක් කල් ගියේය.

அதன்படி சபை பி. ப. 4.37 மணிக்கு 1969 மே 3, சனிக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 4.37 P.M., until 2 P.M. on Saturday, 3rd May 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### රාජ්‍ය සංස්ථා සේවකයින්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක්

### கூட்டுத்தாபன ஊழியர்களுக்கு ஓய்வுச்சம்பளத் திட்டம்

### PENSION SCHEME FOR CORPORATION EMPLOYEES

**785/69**

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සියලුම රජයේ සංස්ථාවන්හි සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීමට එතුමා පියවර ගන්නවාද? (ආ) එසේ නම්, ඒ පිළිබඳ සියලු විස්තර මෙම සභාවට ඉදිරිපත් කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்கக் கூட்டுத்தாபன ஊழியர்களுக்கென ஓய்வுச் சம்பள திட்டம் ஏற்படுத்த நடவடிக்கைகள் எடுப்பாரா? (ஆ) அப்படியாயின், அத்திட்டம் சம்பந்தமான விபரங்களைச் சமர்ப்பிப்பாரா?*

asked the Minister of Finance: (*a*) Will he take steps to establish a pension scheme for employees in state corporations? (*b*) If so, will he table details pertaining to such scheme?

**එන්. විමලසේන මයා.** (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(අ) දායක මුදල් ගෙවීමේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සැලකිල්ලට භාජනව පවතී. (ආ) මේ ප්‍රශ්නය පැන නොනගී.

*(அ) உதவுதொகை செலுத்து உபகாரச் சம்பளத்திட்டமொன்று பரிசீலனையிலுள்ளது. (ஆ) இதற்கிடமில்லை.*

(*a*) A contributory pension scheme is under consideration. (*b*) Does not arise.

### විශ්‍රාම ලත් එච්. එල්. ඒ. එල්. විජේසේකර ගුරු මහතා

### திரு. எச். எல். ஏ. எல். விஜேசேகர, இளைப்பாறிய ஆசிரியர்

### MR. H. L. A. L. WIJESEKERA, RETIRED TEACHER

**786/69**

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) අම්පාරේ වාවින්න විදුහලේ එච්. එල්. ඒ. එල්. විජේසේකර මහතා 1968.10.1 වන දින සිට විශ්‍රාම ලැබූ බවත්; (ii) විජේසේකර මහතාට මෙතෙක් තාවකාලික විශ්‍රාම වැටුපක් ගෙවා නැති බවත්; එතුමා දන්නවාද? (ආ) මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයයේ ප්‍රමාදය නිසා විජේසේකර මහතා ආර්ථික අමාරුකම් වලින් මිරිකී සිටින හෙයින් වහාම තාවකාලික විශ්‍රාම වැටුපක් ගෙවීමට එතුමා අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට නියෝග කරනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) அம்பாறை வெலின்ன வித்தியாலயத்தைச் சேர்ந்த திரு. எச். எல். ஏ. எல். விஜேசேகர 1.10.1968 இல் ஓய்வெடுத்துக் கொண்டார் என்பதையும், (ii) இதுவரை உணவுப்படி அவருக்குக் கொடுக்கப்படவில்லை என்பதையும் அறிவாரா? (ஆ) இவ்விடயத்தில் மட்டக்களப்பு கல்வி அலுவலகத்தின் தாமதத்தினால் திரு. விஜேசேகர கஷ்டப்படுவதால், உடனேயே இப்படியை அவருக்குக் கொடுக்கும்படி கல்வி அதிபதியைப் பணிப்பாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware (i) that Mr. H. L. A. L. Wijesekera of Wewinna Vidyalaya, Amparai, retired on 1.10.1968; and (ii) that he has not been paid an alimentary allowance to date? (*b*) Will he instruct the Director of Education to pay this allowance immediately to Mr. Wijesekera, who is in distress as a result of the Education Office, Batticaloa, delaying this matter?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(අ) (i) එසේය. (ii) මෙම ගුරුවරයාට තාවකාලික විශ්‍රාම වැටුප් දැන් ගෙවනු ලැබේ. (ආ) පැන නොනගී.

(*a*) (i) Yes. (ii) This teacher is being paid an alimentary allowance at present. (*b*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org